# වෛරී කථනය

## වසංගත කාලය අතරතුර ශ්‍රී ලංකාවේ වෛරී කථනය



Co-funded by the European Union

#MINORMATTERS

Norad

**වසංගත කාලය අතරතුර ශ්‍රී ලංකාවේ වෛරී කථනය**

කොළඹ, 2020

ප්‍රකාශන හිමිකම © MinorMatters

Minority Rights Group හි සහයෝගිතාවයෙන් සම්පාදනය කරන ලදී

MinorMatters යනු ජාතික ක්‍රිස්තියානි ධර්මදාන සංගමයේ (NCEASL) මුලපිරීමකි.

NCEASL හි ලිඛිත අවසරය ඇතිව පමණක්, මූලාශ්‍රය පිළිගැනීමට ලක් කරමින්, මෙම ප්‍රකාශනය ඕනෑම සංවිධානයක් විසින් ආගමික නිදහසට අදාළ ක්‍රියාකාරකම් සඳහා ප්‍රතිනිෂ්පාදනය කළ හැකිය. මෙම ප්‍රකාශනයේ කිසිදු කොටසක් NCEASL හි අවසරයකින් තොරව අනුවතර්නය කිරීමට, කවර හෝ ස්වරූපයකින් හෝ ආකාරයකින් බෙදා හැරීමට හෝ දත්ත සමුදායන් ලබා ගැනීමේ පද්ධතියක ගබඩා කිරීමට නොහැකිය. මෙය කිසිදු ආකාරයකින් හෝ වෙනත් වාණිජමය කටයුතු සඳහා භාවිතය සහ ප්‍රතිනිෂ්පාදනය තහනම්ය.

## පටුන


ස්තුතිය ........ 5
පසුබිම ........ 1
වෛරී අපරාධ සහ අපරාධ සඳහා දඬුවම් නොලබා සිටීම ........ 2
ක්‍රමවේදය ........ 7
වෛරී කථනය යනු කුමක්ද? ........ 8
සොයාගත් කරුණු ........ 11
සිංහල බසින් වූ පෝස්ටු ........ 11
භූමදාන චාරිත්‍ර සම්බන්ධ මතභේදය ........ 14
දෙමළ බසින් වූ පෝස්ටු ........ 14
ස්විස් පාදිලිතුමා සම්බන්ධ සිදුවීම ........ 16
නිගමන ........ 18
නිදෙර්ශ ........ 21
රජය හා එහි ආයතන සඳහා ........ 21
සමාජ මාධ්‍ය වේදිකා සඳහා ........ 22
ප්‍රධාන ප්‍රවාහයේ මාධ්‍ය සඳහා ........ 22
සිවිල් සමාජය සඳහා ........ 22

## ස්තුතිය

ශ්‍රී ලංකාවේ, ජනවාගර්ික අධ්‍යනය සඳහා වන ජාත්‍යන්තර මධ්‍යස්ථානයෙහි විධායක අධ්‍යක්ෂ ආචාර්ය මාරියෝ ගෝමස් මෙම වාතර්ාවේ කතර්ෘවරයා වේ. වාතර්ාව සඳහා දත්ත ඒකරාශී කරන ලද්දේ NCEASL හි සන්ජුලා පීටසර් සහ Hashtag Generation හි ප්‍රියදශර්ිනී විජයරත්නම් විසිනි. යාමිණී රවීන්ද්‍රන් (NCEASL හි නීති හා උද්දේශන අධ්‍යක්ෂිකා), ෂැලෝම් ඩැනියල්, අනුෂ්කා විජේසිංහ සහ ජෂාන් ජෙගසෝති යන අයගෙන් සමන්විත NCEASL කණ්ඩායම මෙම වාතර්ාව සමාලෝචනයටත් ඊට උපකාර ලබාදීමටත් කටයුතු කළහ.

කලින් ලංකා ධමර්දාන සහෝදරත්වය (Evangelical Fellowship of Ceylon) යන නමින් හැඳින්වුනු ශ්‍රී ලංකා ජාතික ක්‍රිස්තියානි ධමර්දාන සන්ධානය (National Christian Evangelical Alliance of Sri Lanka (NCEASL)) 1952 දී ආරම්භ කරන ලද්දකි. NCEASL හි ආගමික නිදහස සහ සමාජ යුක්ති කොමිසම (RLC) උද්දේශනය, පයෙර්ෂණ, ලේඛනගත කිරීම, පුහුණු හා අධ්‍යාපනය හරහා පුද්ගලයින්ගේ ආගම් ඇදහීමේ හා විශ්වාස දැරීමේ නිදහස ප්‍රගමනය පිණිස ශ්‍රී ලංකාවේ ආගමික ප්‍රජාවන්ට එරෙහිව සිදුවන ප්‍රචණ්ඩත්ව ක්‍රියා, බියවැද්දීම් සහ වෙනස්කොට සැලකීම් අධීක්ෂණයේ සහ ලේඛනගත කිරීමේ නිරත වෙයි.

NCEASL RLC හි මූලපිරීමක් වන MinorMatters, ශ්‍රී ලංකාවේ ආගමික සහයෝගීතාවය පෝෂණය කිරීම සඳහා සහ ආගම් ඇදහීමේ හා විශ්වාස දැරීමේ අයිතිවාසිකම ආරක්ෂා කිරීම සඳහා කැපවුණු ජනතා ව්‍යාපාරයක් වේ. ප්‍රතිසන්ධානය ඉදිරියට ගෙනයෑමට, ආගමික අන්තවාදය මැඩලීමට සහ ජාතික සහජීවනය ප්‍රවධර්නයට දරන වෑයම් සවිබලගැන්වීමට MinorMatters හරහා කටයුතු කරනු ලැබේ.

යුරෝපීය සංගමයේ ද සංවධර්න සහයෝගීතාවය සඳහා වන නෝවර්ජියානු ආයතනයේ (NORAD) ද උපකාර ඇතිව මෙම ප්‍රකාශනය නිෂ්පාදනය කරන ලදී. මෙම ප්‍රකාශනයේ අන්තගර්තය සඳහා NCEASL විසින් පූණර් වගකීම දරන අතර යුරෝපීය සංගමයේ හෝ NORAD හි අදහස් ඉන් පිළිබිඹු වන බවක් කිසිසේත්ම නොසැලකිය යුතු ය.

මෙම වාතර්ාව බෙදාහැරීමේ හිමිකම NCEASL සතු ය. මූලාශ්‍රය සඳහන් කරන්නේ නම් සහ එසේ යොදාගන්නා බව NCEASL වෙත දැනුම් දෙන්නේ නම්, ඕනෑම සංවිධානයකට මානව හිමිකම් අධ්‍යාපන ක්‍රියාකාරකම් සඳහා මෙම ප්‍රකාශනය ප්‍රතිනිෂ්පාදනය කිරීමට හැකි ය.

ඔබේ අදහස් පහත ඊමේල් ලිපිනයට එවන්න:

rlc@nceasl.org

## පසුබිම

වෛරී කථනය බොහෝ සමාජවල සාමාන්‍ය ලක්ෂණයක් බවට පත්වී ඇති අතර, සමාජ මාධ්‍ය, ප්‍රධාන ධාරාවේ මුද්‍රිත හා ඉලෙක්ට්‍රොනික මාධ්‍ය, සහ අනෙකුත් වේදිකාවන් හි මෙය දක්නට හැකි ය. ශ්‍රී ලංකාවේ එය ජනවාගරික හා ආගමික කණ්ඩායම්, කාන්තාවන්, මානව හිමිකම් හා සාම ක්‍රියාධරයින්, සමරිසි හා සංක්‍රාන්ති ලිංගික තැනැත්තන්, ආබාධ සහිතව ජීවත්වන තැනැත්තන් හා සංක්‍රමණිකයින් කෙරෙහි ශ්‍රී ලංකාවේ වෛරී කථනය යොමු වී තිබේ. නවීන ජංගම දුරකථන යෙදුම් සහ නවීන උපාංග වැනි නූතන තාක්ෂණයන් හා යෙදුම්, මෑතකාලීන වෂර්වලදී සමාජ මාධ්‍ය හරහා මේ සම්බන්ධයෙන් හුවමාරු වන පෝස්ටු හා අදහස් පලකිරීම් අතිමහත් ලෙස වධර්නය කිරීමට හේතු වී තිබේ. මේ නව යෙදුම්, වෛරී කථනය පැතිරීමට යන වේලාව අඩුවීමටත් ඒවා පැතිරෙන පරාසය වඩාත් පුළුල් කිරීමටත් හේතු වී තිබේ.[1]

ගෙවී ගිය දසවසර තුළ ජංගම දුරකථන භාවිතය බොහෝ වේගයෙන් වධර්නය වී ඇති අතර ඒ හා සමගාමීව ම අන්තජර්ාලයේ ව්‍යාප්ති වේගය වධර්නය වී තිබේ. 2019 වෂර්ය අවසාන වන විට, ශ්‍රී ලංකාව තුළ ඇති සමස්ථ ජංගම දුරකථන සබඳතා සංඛ්‍යාව, ඊට පෙර වෂර්යේ වූ මිලියන 32.5 සිට 32.9 දක්වා ඉහළ ගොස් තිබුණි. සෑම පුද්ගලයින් 100 දෙනෙකුටම ඇති ජංගම දුරකථන සබඳතා සංඛ්‍යාව අනුව මනිනු ලබන ජංගම දුරකථන ව්‍යාප්තිය 2019 වෂර්ය අවසානය වන විට 150.8ක් විය. වෙනත් අන්දමකින් කියන්නේ නම්, ජනගහනයේ සෑම සාමාජිකයකුටම සිම් කාඩ්පත් දළ වශයෙන් 1.5 බැගින් වන තරමට එය ව්‍යාප්ත වී තිබුණි. 2018 දී ජංගම දුරකථන සබඳතා ප්‍රමාණය 15%ක් තරම් ප්‍රමාණයකින් වධර්නය වී තිබුණි.[2]

ගත වූ වෂර් තුළ අන්තජර්ාල සම්බන්ධකතා ද වධර්නය වී ඇති අතර, 2019 දී එය සියයට 26.9කින් ව්‍යාප්ත වී තිබේ. 2019 වසර අග වනවිට දී අන්තජර්ාල ව්‍යාප්තිය 61.5ක් විය.[3] එක් වෙබ් අඩවියකට අනුව, 2020 ඔක්තෝබර් මාසය වනවිට ෆේස්බුක් සමාජජාලයේ ශ්‍රී ලාංකිකයින් 7,302,000ක් සිට ඇත. එම වෙබ් අඩවියට ම අනුව, ඔවුන් අතරින් 64.7%ක් පුරුෂයින් වූ අතර, 35.3%ක් කාන්තාවන් විය. අවුරුදු 24-35 වයස් කාණ්ඩයේ පරිහරණය කරන්නන් 2,530,000ක් වූ අතර, පරිහරණය කරන සමස්ථ ප්‍රමාණයෙන් එය 34.4%ක් විය.[4] ෆේස්බුක් පරිහරණය කරන්නන් අතරින් 5.3%ක් පමණක් වයස අවුරුදු 55 ඉක්මවූ කාණ්ඩයට අයත් වූහ.

---

[1] Shilpa Samaratunga and Sanjana Hattotuwa, *Liking Violence: A study of hate speech on Facebook in Sri Lanka*, (Centre for Policy Alternatives, 2014) and Sanjana Hattotuwa, (2019) Between Scylla and Charybdis: Social Media in Sri Lanka's Constitutional Referendum, The Round Table, 108:6, 695-707, (The Commonwealth Journal of International Affairs) https://doi.org/10.1080/00358533.2019.1688464 ද බලන්න.

[2] ශ්‍රී ලංකා මහ බැංකුව, 2019 වාෂරික වාතර්ාව, පි.119-120, https://www.cbsl.gov.lk/sites/default/files/cbslweb_documents/publications/annual_report/2019/en/7_Chapter_03.pdf සබැඳියෙන් ලබාගත හැකි ය.

[3] ශ්‍රී ලංකා මහ බැංකුව, 2019 වාෂරික වාතර්ාව, පි.119, https://www.cbsl.gov.lk/sites/default/files/cbslweb_documents/publications/annual_report/2019/en/7_Chapter_03.pdf. සබැඳියෙන් ලබාගත හැකි ය.

[4] https://napoleoncat.com/stats/facebook-users-in-sri_lanka/2020/10.

## වෛරී අපරාධ සහ අපරාධ සඳහා දඬුවම් නොලබා සිටීම

ගෙවී ගිය දසවසර තුළ ශ්‍රී ලංකාවේ ජනවාගරීක-ආගමික ආතතීන් සැලකියයුතු පමණකින් ඉහළ ගොස් ඇතිබව දකින්නට තිබේ. ආගමික පෙළඹවීම් මත සිදුකරන ප්‍රචණ්ඩත්ව ක්‍රියා සහ ආගමික සුළුතර කණ්ඩායම්වලට එරෙහිව සිදු කරන වෛරී කථන ඇතුළු වෛරී අපරාධ සංඛ්‍යාව ඉහළ ගොස් ඇති අතර, මෙම ප්‍රචණ්ඩත්ව ක්‍රියා හා වෛරී කථනයන් අතරින් බොහොමයකට මුහුණදීමට සිදුව ඇත්තේ මුස්ලිම්වරුන්ට සහ ඉවැන්ජලික ක්‍රිස්තියානි භක්තියකයින්ටයි. ආගමික ප්‍රචණ්ඩත්වය ශ්‍රී ලංකාවට නුහුරු දෙයක් නොවෙතත්, මෑත කාලීනව එවැනි ප්‍රචණ්ඩත්ව ක්‍රියා සිදුවන වාර ගණන සහ ඒවායේ තීව්‍රත්වය අළුත්ම සංසිද්ධියක් බවට පත්ව තිබේ.[5] අපරාධ සඳහා දඬුවම් නොලැබෙන සහ රිට් ආඥා ක්‍රියාත්මක කිරීමටත් වරදකරුවන්ට නඩුපැවරීමටත් රජය මැලිකම් දක්වන පරිසරයක් තුළ වෛරී අපරාධ සහ වෛරී කථනය වඩර්නය වී ඇත. ඒ හා සමගාමීව ම, දේශපාලන බලය අත්පත් කරගැනීමටත් තවදුරටත් පවත්වාගෙන යාමටත් ආගමික අනන්‍යතාවය අතකොළුවක් කරගැනීමට දේශපාලන ප්‍රභූන් නොපැකිළ ක්‍රියාකර තිබේ.

2014 ජූනි මාසයේ අළුත්ගම සහ ඒ ආසන්න ප්‍රදේශවල දී, 2014 නොවැම්බර් මාසයේ ගිංතොට දී, 2018 පෙබරවාරි මාසයේ අම්පාරේ සහ ඒ අවට, 2018 මාතර්චු මාසයේ දිගන හා තෙල්දෙණිය ප්‍රදේශවල, සහ පාස්කු ඉරිදා ප්‍රහාරවලින් පසුව 2019 මැයි මාසයේ දී ගම්පහ, කුරුණෑගල හා පුත්තලම දිස්ත්‍රික්කවල දී මුස්ලිම්වරුන්ට එරෙහිව ප්‍රචණ්ඩත්ව ක්‍රියා සිදු විනි. මුස්ලිම් පල්ලි හා පෞද්ගලික දේපළවලට අමතරව මුස්ලිම් ව්‍යාපාර සහ ආර්ථික සමෘද්ධිමත්බව හඟවන සංකේත මෙහි දී ඉලක්ක බවට පත් විය.

ගෙවී ගිය වෂර් තුළ ඉවැන්ජලික ක්‍රිස්තියානි බැතිමතුන් ද එසේ ඉලක්ක බවට පත් වී තිබේ. ශාරීරික ප්‍රහාර, වන්දනා ස්ථානවලට එල්ල කළ ප්‍රහාර, ආගමික මෙහෙයවල් සඳහා බාධා පැමිණවීම, සහ භූමදාන අවස්ථා ඇතුළු ආගමික චාරිත්‍ර ඉටුකිරීමට අවහිර කිරීම මීට ඇතුළත් ය. ඇතැම් සිදුවීම්වලදී ඔවුන් විසින් ප්‍රචණ්ඩ ක්‍රියා සිදුකර තිබේ. ප්‍රචණ්ඩත්වයේ නියැළීම සඳහා අන්‍යයින් පෙළඹවීම ඇතුළු ප්‍රචණ්ඩත්වය සඳහා බෞද්ධ පැවිදි පක්ෂයේ සාමාජිකයින් ද සම්බන්ධ වී ඇති බව යෝජනා කෙරෙන සාක්ෂි පුද්ගලයින් විසින් ලබාදුන් විස්තර කථනයන් හි ඇතුළත් ය.[6]

---

[5] 1883 ක්‍රිස්තියානි-විරෝධී කැරැළි පිළිබඳ විස්තර සඳහා G.P.V Somaratna, *Kotahena Riot 1883: A Religious Riot in Sri Lanka*, (Deepanee Printers, 1991) බලන්න; 1915 මුස්ලිම්-විරෝධී කැරැළි පිළිබඳ විස්තර සඳහා Kumari Jayawardene, , 'Economic and Political Factors in the 1915 Riots' (1970) 29(2) *The Journal of Asian Studies* 223 සහ Shamara Wettimuny, '*Regulating Religious Rites: Did British Regulation of "Noise Worship" Trigger the 1915 Riots in Ceylon?*' (London School of Economic and Political Science, 31 March 2018) at www.blogs.lse.ac.uk/lseih/2018/03/31/regulating-religious-rites-did-british-regulation-of-noise-worship-trigger-the-1915-riots-in-ceylon/ බලන්න.

[6] ශ්‍රී ලංකාවේ අන්තර්-ආගමික සබඳතා සහ අන්තර්-ආගමික ප්‍රචණ්ඩත්වය සම්බන්ධයෙන් මෑතකදී ලියැවුණු ලේඛන සඳහා Gehan Gunatilleke, *The Chronic and the Acute: Post-War Religious Violence in Sri Lanka* (International Centre for Ethnic Studies and Equitas, 2015); Gehan Gunatilleke, *The Chronic and the Entrenched: Ethno-Religious Violence in Sri Lanka* (International Centre for Ethnic Studies and Equitas, 2018); Benjamin Schonthal, 'Environments of Law: Islam, Buddhism, and the State in Contemporary Sri Lanka' (2016) 75(1) *The Journal of Asian Studies* 137; Benjamin Schonthal, 'Litigating Vinaya: Buddhist Law and Public Law in Contemporary Sri Lanka' (2018) 3 *Buddhism Law & Society* 1; Mohamed Faslan and Nadine Vanniasinkam, *Fracturing Community: Intra-Group Relations among the Muslims of Sri Lanka* (International Centre for Ethnic Studies, 2015); Farah Mihlar, *Coming out of the Margins: Justice and Reconciliation for Conflict-Affected Muslims in Sri Lanka* (International Centre for Ethnic Studies, 2018); Farzana Haniffa and Vijay Nagaraj, *Towards Recovering Histories of Anti-Muslim Violence in the Context of Sinhala-Muslim Tensions in Sri Lanka* (International Centre for Ethnic Studies, 2016); Ameer Ali, 'Four Waves of Muslim-Phobia in Sri Lanka:

2015 සිදු වූ දේශපාලන මාරුව සහ මෙම කාලය තුළ ඇති වූ වෙනස්කම් වඩාත් ඉවසනසුළු දේශපාලන සංස්කෘතිය තිබියදී පවා, ජනවාගරීක-ආගමික සබඳතා තවදුරටත් පසුවූයේ ප්‍රශ්නකාරී තත්වයකයි. මින් ගම්‍ය වූයේ ජනවාගරීක-ආගමික කණ්ඩායම් අතරේ ක්‍රමයෙන් වධර්නය වන දෙකඩවීමක්, එනම්, බෙදීම් තවදුරටත් ගැඹුරු කරවීමටත් ආතතීන් වැඩිකිරීමටත් හේතුවෙමින් අන්තගාමීන් සහ රජය විසින් පෝෂණය කළ සහ මෙහෙයවූ දෙකඩවීමක් ය.

සමාජ මාධ්‍ය තුළ වෛරී කථනය බහුලව පැතිරී පවතින අතර, වරදට දඬුවම් නොලබන මෙම පසුබිම තුළ එය තවත් හොඳින් වැජඹෙන්නට ගෙන තිබේ. ශ්‍රී ලංකාවේ නීතියෙන් වෛරී කථනය යනු වරදක් වන බව නම්කර ඇතත් මේ සම්බන්ධයෙන් වාතර්ාවන නඩු පැවරීම් කිසිත් නොමැත.[7] උදාහරණයක් වශයෙන්, සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුති පනතේ (ICCPR Act) මෙසේ සඳහන් වේ:

> *කිසිම තැනැත්තකු විසින්, යුද්ධය පැතිරවීම හෝ වෙනස් ලෙස සැලකීමට, එදිරිවාදිකම්වලට හෝ ප්‍රචණ්ඩ ක්‍රියාවලට යොමුකිරීම සංයුක්ත වන ජාතික, වාගරීක හෝ ආගමික වෛරය සඳහා පෙළඹවීම නොකළ යුතු ය...*
>
> *(1) උපවගන්තියේ සඳහන් වරදක්-*
>
> *(අ ) සිදුකිරීමට තැත් කරන;*
>
> *(ආ ) සිදුකිරීමට ආධාර හෝ අනුබල දෙන;*
>
> *(ඇ ) සිදුකරන බවට තජර්නය කරන,*

---

c.1880–2009' (2015) 35(4) *Journal of Muslim Minority Affairs* 486; *The Quest for Redemption: The Story of the Northern Muslims – Final Report of the Citizens' Commission on the Expulsion of Muslims from the Northern Province by the LTTE in October 1990*, 2nd edn (Law & Society Trust, 2011); Dhammika Herath and Harshana Rambukwella, *Self, Religion, Identity and Politics: Buddhist and Muslim Encounters in Contemporary Sri Lanka* (International Centre for Ethnic Studies, 2015); Neil Devotta, 'Religious Intolerance in Post-Civil War Sri Lanka' (2018) 49(2) *Asian Affairs* 278; National Christian Evangelical Alliance of Sri Lanka, *The Role of Religion in Transitional Justice in Sri Lanka: A Faith Exploration – Right to Truth, Justice and Human Dignity* (National Christian Evangelical Alliance of Sri Lanka, 2018); UN OHCHR, 'Report of the UN Special Rapporteur on Freedom of Religion or Belief, Dr. Ahmed Shaheed, to the Human Rights Council, following a country visit to Sri Lanka in August 2019' (28 February 2020) UN Doc A/HRC/43/48/Add.2, at www.ohchr.org/EN/Issues/FreedomReligion/Pages/Visits.aspx; National Christian Evangelical Alliance of Sri Lanka, *Religious Freedom Violations in Sri Lanka: The Use Of Right to Information Law To Assess The Response Of Law Enforcement Authorities And The Judiciary, Phase 1,* (National Christian Evangelical Alliance of Sri Lanka, 2020); Ranmini Vithanagama, *Tracking Coexistence: Understanding Perceptions of the Religious 'Other'*, (International Centre for Ethnic Studies, 2020) and Mario Gomez, *Prosecuting Religious Violence in Sri Lanka.* In Thio Li-ann and Jaclyn L Neo (eds), '*Religious Offences in Common Law Asia: Colonial Legacies, Constitutional Rights and Contemporary Practice'*, (Hart: 2020) බලන්න.

[7] ආගමික වරද සඳහා නීති හතරක් අදාළ වේ: 2007 සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුති පනත; දණ්ඩනීති සංග්‍රහය, විශේෂයෙන්ම එහි 291අ, 291ආ සහ 120 වගන්ති; 1865 අංක 16 දරන පොලිස් ආඥාපනත; ත්‍රස්තවාදය වැලැක්වීමේ පනත, එහි 2(1)(ඌ) වගන්තිය බලන්න. තවද, 2007 අංක 24 දරන පරිගණක අපරාධ පනත බලන්න. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 10වැනි වගන්තියෙන් සිතීමේ, හෘද සාක්ෂියේ හා විශ්වාස දැරීමේ නිදහසත්, ආගමක් හෝ විශ්වාසයක් ඇදහීමේ හා වැළඳගැනීමේ නිදහසත් සහතික කර තිබේ. එය, ආරක්ෂා කරන ලද විධිවිධානයක් වන අතර, එබැවින් එම අයිතිවාසිකම් සීමා කළ නොහැක. එකලාව හෝ අන් අය සමග, ප්‍රසිද්ධියේ හෝ පෞද්ගලිකව තම ආගමහෝ විශ්වාසය ලබ්ධිය හෝ විශ්වාසය ඇදහීමෙන්, පිළිපැදීමෙන්, ප්‍රගුණ කිරීමෙන් සහ ඉගැන්වීමෙන් ප්‍රකාශ කිරීමේ නිදහස 14(1)(ඉ ) වගන්තියෙන් ආරක්ෂා කර දෙයි. 10වැනි වගන්තිය මෙන් නොව, 14(1)(ඉ ) වගන්තියේ ඇතුළත් අයිතිවාසිකම් ජාතික ආරක්ෂාව, මහජන සාමය සහ මහජන සෞඛ්‍ය හෝ සදාචාරය ආරක්ෂා කිරීම සඳහා හෝ අන්‍යයින්ගේ අයිතිවාසිකම් හා නිදහස සඳහා නිසි පිළිගැනීම හා ගෞරවය ලබාදීම සඳහා හෝ ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක පොදු සුභසාධනය උදෙසා සීමා කළ හැකිය. 14(1)(අ ) වගන්තියෙන් අදහස් පළ කිරීමේ නිදහස ආරක්ෂා කර දී ඇත.

> *සෑම තැනැත්තෙක් ම, මේ පනත යටතේ වූ වරදකට වරදකරු වන්නේ ය.*[8]

යම් තැනැත්තකුගේ හෝ කණ්ඩායමක ආගමික හැඟීම් රිදවීම හෝ කුපිත කරවීම දණ්ඩනීති සංග්‍රහයෙන් වරදක් බවට පත් කර තිබේ.[9] තවද ත්‍රස්තවාදය වැළැක්වීමේ පනතේ මෙසේ විධිවිධාන සලසා තිබේ:

> *කියනු ලබන, නැතහොත් කියවීමට අදහස් කරනු ලැබූ වචන මගින් හෝ සංඥා මගින් හෝ දෘෂ්‍ය නියෝජන මගින් හෝ අන්‍යාකාරයකින් සාහසික ක්‍රියා හෝ විවිධ ජන කොටස් නැතහොත් වාගරීය හෝ ආගමික කණ්ඩායම් අතර ආගමික, වාගරීක හෝ ජාතිවාදී අසංගතිය නැතහොත් දුවෙර්තනික හෝ එදිරිවාදි හැඟීම් ඇතිවීමට සලස්වන්නා වූ ද, හෝ ඇතිවීමට සැලැස්වීමට අදහස් කරන්නාවූ ද ඕනෑම තැනැත්තකු වරදක් සඳහා වරදකරු වේ.*[10]

මෙම විධිවිධාන තිබුණද, වෛරය පතුරුවන්නන්ට දඬුවම් නොලබා තම ක්‍රියාන්විතය ගෙනයාමට ඉඩ දී තිබේ.[11] ඒ වෙනුවට සිදුව ඇත්තේ ආගමික හා ජනවාගරීක සුළුතර කණ්ඩායම්වල සාමාජිකයින් ඉලක්ක කරගනිමින් තෝරාබේරාගත් පිරිසක් මත පමණක් ඒවා අදාළ කිරීමයි.[12] මෑතකාලීනව අන්තර් ආගමික සබඳතා හා අදාළව සිදුකළ සැලකිය යුතු එකම නීති කෘත්‍ය වන්නේ දැඩිමතධාරී බොදු බල සේනා (BBS) සංවිධානයට නායකත්වය දෙන ගලගොඩ අත්තේ ඥානසාර හිමියන් වෙත දඬුවම් නියම කිරීමයි. කෙසේවුවද, එම හිමියන් වරදකරු කරන ලද්දේ පුවත්පත් කලාවේදියකු ගේ අතුරුදන්වීම සම්බන්ධයෙන් පවත්වනු ලැබූ විමශර්නයකට බාධා කරමින් සහ අධිකරණයේ මුලසුනේ සිටි මහේස්ත්‍රාත්වරයකුට බැනවැදෙමින් හැසිරීම සම්බන්ධයෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 105 වගන්තිය යටතේ අධිකරණයට අපහාස කිරීමේ වරදට මිස ආගමික සබඳතා හා බැඳුනු කිසිදු වරදකට නොවේ.[13]

---

[8] 2007 සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුති පනත, 3(1) සහ (2) වගන්ති.

[9] දණ්ඩනීති සංග්‍රහයේ 291අ වගන්තිය බලන්න: *යම් තැනැත්තෙකුගේ ආගමික හැඟීම්වලට රිදවීමේ ඒකාන්ත අදහසින් එකී තැනැත්තාට ඇසෙන ලෙස යමෙකු යම් වචනයක් කියතොත් හෝ ශබ්දයක් කළහොත් හෝ එකී තැනැත්තාට පෙනෙන පරිදි යම් සංඥාවක් කරතොත් හෝ එකී තැනැත්තා අභිමුඛයෙහි යම් ද්‍රව්‍යයක් තබතොත්, ඔහුට අවුරුද්ද දක්වා කාලයක, දෙයාකාරයකින් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් හෝ දඩයකින් හෝ එකී දඬුවම් දෙකින්ම දඬුවම් කළ යුතුය;* සහ 291ආ වගන්තිය බලන්න: *ආගමික හැඟීම් කෙලසීම සඳහා ඒකාන්ත හා ද්වේෂ සහගත අදහසින් භාෂිත හෝ ලිඛිත වචනයෙන් හෝ දැකිය හැකි නිරූපණවලින් එකී පංතියේ ආගමට හෝ ආගමික විශ්වාසවලට නින්දා කරන හෝ නින්දා කිරීමට තැත් කරන තැනැත්තෙකුට අවුරුදු දෙක දක්වා කාලයක, දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් හෝ දඩයකින් හෝ එකී දඬුවම් දෙකින්ම දඬුවම් කළ යුතුය.* දණ්ඩ නීති සංග්‍රහයේ 120 වගන්තිය ද බලන්න.

[10] 1979 අංක 48 දරන ත්‍රස්තවාදය වැළැක්වීමේ පනතේ 2(ඊ(ඌ) වගන්තිය.

[11] Centre for Policy Alternatives, '*Confronting Accountability for Hate Speech in Sri Lanka: A Critique of the Legal Framework*' (2018) ද බලන්න.

[12] උදාහරණ වශයෙන් *The Democratic Socialist Republic of Sri Lanka v JS Tissainayagam* [2008] HC 4425/2008 නඩුව බලන්න. එහිදී, අන්තජර්ාලයේ පලවන ජනර්ලයකට ලබාදුන් හානිදායක නොවන ප්‍රකාශයක් දඩමීමා කරගනිමින් ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ එම පුවත්පත් කලාවේදියාට දඬුවම් පමුණුවන ලදී. තවද, ශක්තික සත්කුමාර ගේ නඩුව පහත සාකච්ඡා කර ඇත.

[13] *In re Galagoda Aththe Gnanasara* (Court of Appeal Minutes, 8 August 2018). ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 105(3) වගන්තිය මෙසේ ය: '*ශ්‍රී ලංකා ජනරජයේ ශ්‍රේෂ්ඨාධිකරණය සහ ශ්‍රී ලංකා*

පසුව එම හිමියන් වරදකරු කිරීම ශ්‍රේෂ්ඨාධිකරණයෙන් ද තහවුරු කරන ලදී. මින් පෙර අවස්ථාවකදී ද එකී සිදුවීම ම සම්බන්ධයෙන් සාපරාධී බියවැද්දීමට හා හිංසනයට ඥානසාර හිමියන් වරදකරු වී තිබේ.[14] ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන වෙතින් ජනාධිපති සමාව ලැබූ ඥානසාර හිමියන් 2019 මැයි මාසයේදී නිදහස් විය. දැනට මෙම සමාවදීම ශ්‍රේෂ්ඨාධිකරණය වෙත ඉදිරිපත් කළ මූලික අයිතිවාසිකම් අයදුමක වස්තු විෂයය වේ.[15]

2018 මාතර් මාසයේ දී දිගන සහ ඒ අවට ප්‍රදේශවල ඇති වූ ප්‍රචණ්ඩත්වයට දායකවීම සම්බන්ධයෙන් ෆේස්බුක් හි භූමිකාව පිළිබඳව 2019 දී ස්වාධීන මානව හිමිකම් බලපෑම් ඇගැයුමක් සිදුකළ ‘Article 1’ මෙසේ නිරීක්ෂණය කර තිබුණි:

> *කටකථා සහ වෛරී කථනය ව්‍යාප්තිය සඳහා ෆේස්බුක් වේදිකාව දායක වූ බවත් එය 'අන්තර්ජාලයෙන් පිටත' ප්‍රචණ්ඩත්වය කෙරෙහි මගපෑදුවාක් වියහැකි බවත් .... විසින් සිදුකළ ඇගැයුමේ දී පෙන්නුම් කෙරිණි. සැබැවින්ම, වෛරී කථනය වැපිරීම (උදා: "සියළු මුස්ලිම්වරුන් මරවු, ළදරුවෙක් වත් ඉතුරු නොකරවු, උන් සියළුදෙනා බල්ලෝ") මෙන්ම වැරදි තොරතුරු ප්‍රචාරය (උදා: මුස්ලිම් ආපනශාලා හිමියකු තම සේවාදායකයින්ගේ ආහාරවලට වඳ පෙති මිශ්‍ර කරන බව ) පුද්ගලයින් අතරේ නොසන්සුන්බව ව්‍යාප්ත කිරීමටත් එම ආපනශාලාකරු සහ තවත් අයට ශාරීරික හානි සිදුකිරීමට දායක වූවාක් විය හැකි ය... .... තම ව්‍යාපාර කටයුතුවලින් සිදුවන, මානව හිමිකම්වලට අහිතකර බලපෑම්වල හානි අඩුකිරීම සඳහා ෆේස්බුක් ආයතනය විසින් නිසි සම්ප්‍රජන්‍යතාවයෙන් යුතුව කටයුතු කළයුතු වේ. කෙසේනමුත්, ෆේස්බුක් ආයතනය විසින් මේ සම්බන්ධයෙන් දැක්වූ ප්‍රතිචාරය මන්දගාමී බවත් ඇතැම් අවස්ථාවල එය ප්‍රමාණවත් නොවූ බවත් Article 1 විසින් සොයාගන්නා ලදී. ... ඇත්තවශයෙන්ම, මෙම මානව හිමිකම් බලපෑම් ඇගැයුමට පෙරාතුව ශ්‍රී ලංකාවේ මානව හිමිකම් සම්බන්ධයෙන් ෆේස්බුක් ආයතනය නිල වශයෙන් දැක්වූ නිසි සම්ප්‍රජන්‍යතාවය ප්‍රමාණවත් නොවීමත්, 2018 මැයි මාසයේ මහනුවර සිදුවීම ඇතිවන අවස්ථාව වන විට ෆේස්බුක් කායර්මණ්ඩලය තුළ වූ සීමිත සංස්කෘතික සහ භාෂා විශේෂඥ දැනුමත් අන්තර්ජාලය හරහා වූ සම්බන්ධවීම් වලින් පැන නැගී අන්තර්ජාලයෙන් බැහැරට විහිදී ගියා වූ හානි සඳහා දායක වූවාක් විය හැකි ය. අන්තගර්තයේ සත්‍යතාවය හෝ අරමුණු කවරක් වුවද ඒවා නොසලකා, පෝස්ටු හරහා එම වේදිකාව මත සම්බන්ධවීම් වැඩිකරවීම අරමුණු කරගෙන සැකසූ, දැනට භාවිතයෙන් ඉවත් කර ඇති ඇල්ගෝරිදමයෙන් මෙය තවදුරටත් උග්‍රකරවීය. ... 2018 සිදුවූ එම අන්තර්ජාල කඩාකප්පල්කාරීත්වයට පෙරාතුව, පිළිගත් ප්‍රජා සම්මතයන් උල්ලංඝනය කරන අන්තගර්තය කලට වේලාවට එම වේදිකාවෙන් ඉවත් කිරීමට අපොහොසත් වීම හරහා ෆේස්බුක් ආයතනය ශ්‍රී ලංකාවට අදාළව ඵලදායී අන්දමින් ප්‍රජා සම්මතයන් ක්‍රියාත්මක කිරීමට අසමත් වී තිබේ.*

---

*ජනරජයේ අභියාචනාධිකරණය යන එක් එක් අධිකරණය ලේඛනෝපගත කිරීමේ ජෝෂ්ඨ අධිකරණයක් වන්නේ ය. අධිකරණයේ දී ම නැතහොත් අන් ස්ථානයක දී ඒ අධිකරණයකට අපහාස කිරීම සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණය හෝ අභියාචනාධිකරණය සුදුසු යැයි සලකන පරිදි බන්ධනාගාරගත කිරීමෙන් හෝ දඩයකින් හෝ බන්ධනාගාරගත කිරීම හා දඩය යන දඬුවම් දෙකින් ම හෝ දඬුවම් කිරීමේ බලය ද ඇතුළුව එබඳු අධිකරණයක සියළුම බලතල ඒ අධිකරණයන්ට ඇත්තේ ය. අභියාචනාධිකරණයේ බලයට මේ ව්‍යවස්ථාවේ 1(ඇ) අනුව්‍යවස්ථාවේ සඳහන් වෙනත් යම් අධිකරණයකට, විනිශ්චය අධිකාරයකට හෝ ආයතනයකට ඒ අධිකරණය, විනිශ්චය අධිකාරය හෝ ආයතනය ඉදිරියේ දී ම හෝ අන් ස්ථානයක දී හෝ අපහාස කිරීම සම්බන්ධයෙන් දඬුවම් කිරීමේ බලය ද ඇතුළත් වන්නේ ය.’.*

[14] ‘Sri Lankan Buddhist Monk Sentenced Six Years’ Jail In Contempt Case’ (*NDTV*, 8 August 2018) https://www.ndtv.com/world-news/sri-lankan-buddhist-monk-sentenced-six-years-jail-in-contempt-case-1897204.

[15] Mario Gomez, *Prosecuting Religious Violence in Sri Lanka*. In Thio Li-ann and Jaclyn L Neo (eds), *Religious Offences in Common Law Asia: Colonial Legacies, Constitutional Rights and Contemporary Practice*, (Hart: 2020;) pp 245 – 280 ද බලන්න.

*වෛරී කථනය සහ අනෙකුත් ස්වරූපයන්හි හිංසන තවදුරටත් ෆේස්බුක් වේදිකාව මත රැඳී තිබීමට මෙන්ම තවතවත් පැතිර යාමට පවා මෙම තත්වය හේතුවිය.* [16]

ආගම ඇදහීමේ හා විශ්වාස දැරීමේ නිදහස පිළිබඳව විශේෂ නියෝජිතවරයා ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් මෑතක දී නිකුත් කළ තම වාතර්ාවේ මෙසේ නිරීක්ෂණ ඇතුළත් කර තිබේ:

> *67. වෛරී කථනයේ නිරතවන්නන්ට තමන්ගේ එම කටයුතු අඛණ්ඩව කරගෙන යාමට නිදහස ඇති බවත් කිසිදු නෛතික ප්‍රතිවිපාකයකට මුහුණ නොදී තමන් සිදුකරන හානිය තවදුරටත් කරගෙන යා හැකි බවත් වින්දිතයින් තුළ පොදුවේ දක්නට ඇති අදහස වී තිබේ. යුක්තිය කරා යාම සඳහා තමන්ට මගක්, නොමැතිකම තුළ, නොකඩවා එල්ල වන වෛරී කථන සහ වෛරී අපරාධවල තජර්නය ඉදිරියේ තමන් අතිශයින් අවදානම්පාත්‍ර බවක් සුළුතර කණ්ඩායම්වලට හැඟෙමින් පවතියි. 2014 අළුත්ගම දී, 2017 ගිංතොට දී මෙන්ම 2018 අම්පාරේදී හා දිගන දී ඇතිවූ ප්‍රචණ්ඩත්වය හේතුවෙන් ඔවුන් පත්වූ කම්පනකාරී තත්වයෙන් පසුව, රජය සහ නීතිය ක්‍රියාත්මක කරන බලධාරීන් පිළිබඳව ඔවුන් බොහෝදෙනා තුළ වූ විශ්වාසය බිඳී ගොස් තිබේ. එකී ප්‍රචණ්ඩකාරී සිදුවීම්වලට දේපළ හානි, මාරක තුවාළ, සහ අළුත්ගම සහ දිගන දී සිදුවූ මරණ ඇතුළත් වේ. මෙම සිදුවීම්, වෛරී කථනය හා වෛරී ප්‍රචණ්ඩත්වය සඳහා, වාගරීක හා ආගමික අනන්‍යතා දේශපාලනීකරණය සඳහා, සුළුතර කණ්ඩායම්, විශේෂයෙන්ම මුස්ලිම් ප්‍රජාව ඉලක්ක බවට පත් කර තිබීම සඳහා, ඇති පැහැදිලි හා නූතන උදාහරණ වේ. මේ එක් එක් සිදුවීම අවස්ථාවේ ප්‍රමාණවත් සාක්ෂි තිබුණ ද, රජයෙන් අත් අඩංගුවට ගැනීම් කිහිපයක් සිදුකළ ද, ඇතැම් වින්දිතයින් වන්දි ගෙවනු ලැබුව ද, ඒවා සිදුවී වෂර් ගණනාවක් ගත වුනු අද දිනය දක්වාම එක් වරදකරුවකු හෝ එම වරද සඳහා වගවන බව සහතික කරගැනීමට නොහැකි වී තිබේ. එසේම, එම ප්‍රචණ්ඩත්වය විශේෂයෙන් මුස්ලිම් ජනතාව කෙරෙහි පමණක්ම සීමා නොවී ඇති බව ද මෙහිදී අවධානයට ගැනීම වටියි; විවිධ කාලවකවානු වලදී දෙමළ ජනතාව හා ක්‍රිස්තියානි ජනතාවට එරෙහිව ද මේ හා සමාන ප්‍රචණ්ඩත්වයක් දියත් වී තිබේ.*[17]

---

[16] Article 1, 'Assessing the Human Rights Impact of the Facebook Platform in Sri Lanka', (2018) ලේඛකයා භාරයේ ගොනුකර පවත්වාගෙන යනු ලැබේ.

[17] UN OHCHR, 'Report of the UN Special Rapporteur on Freedom of Religion or Belief, Dr Ahmed Shaheed, to the Human Rights Council, following a country visit to Sri Lanka in August 2019' (28 February 2020) UN Doc A/HRC/43/48/Add.2, at para 67, www.ohchr.org/EN/Issues/FreedomReligion/Pages/Visits.aspx

## ක්‍රමවේදය

තුන් මාසයක කාල පරිච්ඡේදයක් තුළ (2020 මාතර්ු සිට ජුනි දක්වා), ශ්‍රී ලංකා ජාතික ක්‍රිස්තියානි ධමර්දාන සංගමයේ (NCEASL) පයෙර්ෂකයින් විසින් ශ්‍රී ලංකාවේ ආගමික සුළුතර කණ්ඩායම්වලට එරෙහි වෛරී කථනය සඳහා සාක්ෂි නිරීක්ෂණය කිරීම පිණිස අන්තජර්ාල අඩවි කිහිපයක් සමාලෝචනයට ලක් කරන ලදී. කෝවිඩ්-19 වසංගතයට ප්‍රතිචාර දැක්වීම සඳහා 2020 මාතර්ු 24 වැනි දා පටන් මැයි 10වැනි දා පමණ වන තෙක් ශ්‍රී ලංකාවේ අඛණ්ඩව ඇඳිරිනීතිය පනවා තිබුණි. මෙම විශ්ලේෂණයෙන් ඉහත කී තෙමස් කාල පරිච්ඡේදය තුළ වූ පෝස්ටු (posts) 103ක් සහ ඒවා සඳහා පුද්ගලයින්ගේ කොමෙන්ටු (comments) නොහොත් ඔවුන් පලකළ අදහස් සලකා බලනු ලබන අතර, ඒවායින් පෙන්නුම් කෙරෙන යම් නැඹුරුතා හා රටාවන් හඳුනාගනු ලබයි. මෙම කාලසීමාව තුළ වෛරී කථනය කුමන අන්දමින් යොදාගනු ලැබුවේද යන්නට සහ 'අනෙක්' ආගමට අයත් තැනැත්තා යක්ෂ ස්වරූපයකින් හුවා දැක්වීමට අන්තජර්ාල අවකාශයන් යොදාගත් අන්දමට මෙකල පැවති වසංගත තත්වයෙන් බලපෑමක් වී තිබුණු නමුත්, මීන් පෙර අවස්ථාවලදී යොදාගත් වගර්යේ පෝස්ටු සහ කොමෙන්ටු ම තවදුරටත් යොදාගන්නා අන්දම ද දකින්නට තිබුණි. මෙම පෝස්ටු සහ කොමෙන්ටු හඹායාම සඳහා පහත දැක්වෙන ක්‍රියාදාමය අනුගමනය කරන ලදී.

පළමු පියවරක් වශයෙන් පහත වගර් යටතේ පිටු, කණ්ඩායම් හා වෙබ් අඩවි හඳුනාගන්නා ලදී:

- ඕපාදූප වෙබ් අඩවි
- ප්‍රවෘත්ති මාධ්‍ය
- අන්තජර්ාලයේ පුරවැසි මාධ්‍යවේදීන්
- සුප්‍රකට පුද්ගලයින්ගේ අන්තජර්ාල පිටු

ඉන්පසුව, හඹායාමට අදහස් කළ සිදුවීම් හා සබැඳි මූලපද (keywords) සහ හැෂ්ටැග (hashtags) ලැයිස්තුවක් සහ වැදගත් වන යෙදුම් ඇතුළත් කර සැකසූ ශබ්දකෝෂයක් සම්පාදනය කරන ලදී. තෙමසක කාල සීමාව තුළ සෙවුම් (search) සිදුකිරීම සඳහා, ඉන්පසුව ඒවා යොදාගන්නා ලදී. සෙවුල් හරහා ලැබෙන අදාළ අන්තගර්තයේ, පෝස්ටුවල සහ කොමෙන්ටුවල ස්ක්‍රීන්ෂොට් (screenshot) ලබාගෙන ඒවා පහත දැක්වෙන දත්ත සහිත Google sheet වශයෙන් සකසා ගන්නා ලදී.

- ස්ක්‍රීන්ෂොට් අංකය
- දිනය
- ලියන ලද තැනැත්තා
- පුද්ගලයා හෝ කණ්ඩායම
- අන්තගර්ත වගර්ය (පෝස්ටු/ මීම්/වීඩියෝ/GIF)
- පෝස්ටුව පිළිබඳ කෙටි විස්තරයක්

- ලැබී තිබුණු පිළිගැනීම (ලයික්/ කොමෙන්ට්/ වීව්ස් සංඛ්‍යාවා
- ඉලක්ක කර ඇති කණ්ඩායම/ සුළුතරය
- විශේෂ ගැටළු (විශේෂිත සිදුවීම්)
- වෙනත් අදහස්

මේ අන්දමින් සිංහල හා දෙමළ භාෂාවලින් දත්ත කට්ටල දෙකක් උත්පාදනය කර, ඉංග්‍රීසි භාෂාවට පරිවතර්නය කරන ලද අතර, එය, ඉන්පසුව සිදුකළ විශ්ලේෂණ සඳහා පදනම විය.

## වෛරී කථනය යනු කුමක්ද?

වෛරී කථනය සඳහා පොදු නිවර්චනයක් නොමැති අතර, වෛරී කථනය කුමක්දැයි නිවර්චනය කිරීම ජාත්‍යන්තර මෙන්ම දේශීය වශයෙන් ද අභියෝගයක් වී තිබේ. ඇතැම් රටවල මේ සම්බන්ධයෙන් ඇති නීති පුවත්පත් කලාවේදීන්, මානව හිමිකම් ආරක්ෂකයින්, සහ ආගමික හා ජනවාගරික සුළුතර කණ්ඩායම් හිංසනයට පත් කිරීම සඳහා යොදාගෙන තිබේ. ඇතැම් නීති, තොරතුරු කරා ප්‍රවේශය සීමා කිරීමටත් අන්තජර්ාල ප්‍රවේශය සීමා කිරීමටත් යොදාගෙන තිබේ. නීති හා ප්‍රතිපත්ති මේ අන්දමින් යොදාගෙන ඇති රටවල, නිදහසේ අදහස් ප්‍රකාශනයට හා විරුද්ධ මත දැරීමට ඇති අයිතිවාසිකම් සම්බන්ධයෙන් පොදුවේ ඉන් බාධාකාරී නොහොත් වලක්වාලනසුළු බලපෑමක් ඇතිකර තිබේ. එසේනම්, වෛරී කථනය නියාමනයට ගනු ලබන ක්‍රියාමාගර් නිදහසේ අදහස් පලකිරීම සහ වෛරය, ප්‍රචණ්ඩත්වය හා වෙනස්කොට සැලකීම අවුළුවාලීම අතර නිසි සමබරතාවයක්, ප්‍රායෝගිකව ගත් කළ ඇතැම් අවස්ථාවලදී සාක්ෂාත් කරගැනීමට දුෂ්කර අන්දමේ සමබරතාවයක් සාක්ෂාත් කරගත යුතු වේ. කථනය, පුද්ගලයින් කළඹනසුළු වීමට, අපහසුවක් ඇතිකරවනසුළු වීමට, හෝ විවේචනාත්මක වීමට ඉඩ තිබේ, එහෙත්, එවැනි කථනයක් හරහා ප්‍රචණ්ඩත්වය, එදිරිවාදිකම් හෝ වෙනස්කොට සැලකීම අවුළුවාලන්නේ නම් මිස, එය සීමා නොකළ යුතු ය. මතවාද දැරීමටත්, තොරතුරු හා අදහස් සෙවීමටත්, ලැබීමටත්, ලබාදීමටත් ඇති අයිතිවාසිකම ජාත්‍යන්තර මානව හිමිකම් නීතියෙන් සහතික කර දී ඇති නිදහස් ප්‍රකාශනය සඳහා ඇති අයිතියේ අරටුව වන අදහස් වේ. මෙහි සඳහන් වී ඇති ඇතැම් සිදුවීම්වල දැක්වෙන්නක් සේ, වෛරී කථනය සම්බන්ධයෙන් වන වුවමනාවට වඩා වඩා පුළුල් නිවර්චනයක් හරහා නීත්‍යානුකූල කථනය සීමා කිරීමේ නිදහස රජයකට ලැබෙන්නට පුළුවන.[18] කථනයේ නිදහස ආරක්ෂා කරන අතරේම, සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතියේ මෙසේ සඳහන් වේ:

> *(1) යුද්ධයට පක්ෂපාතී ඕනෑම ප්‍රචාරණයක් නීතියෙන් තහනම් කරනු ලැබේ.*
>
> *(2) වෙනස්කොට සැලකීම, එදිරිවාදිකම් හෝ ප්‍රචණ්ඩත්වය අවුළුවාලීමක් වශයෙන් සැලකිය හැකි ඕනෑම ජාතික, වාගරික හෝ ආගමික වෛරය උද්දේශනයක් නීතියෙන් තහනම් කරනු ලැබේ.*[19]

---

[18] සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතියේ 19 වැනි වගන්තිය බලන්න. මානව හිමිකම් කමිටුවේ පොදු අදහස් දැක්වීි අංක 34 ද බලන්න.

[19] සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතියේ 20 වැනි වගන්තිය බලන්න. සියළු ආකාරවල වාගරික වෙනස්කොට සැලකීම් තුරන්කිරීම පිළිබඳ සම්මුතියේ 4වැනි වගන්තිය ද බලන්න.

වෛරී කථනය වශයෙන් අපරාධ ලෙස සැලකිය යුත්තේ කුමන අදහස් පලකිරීම්දැයි තීරණය කිරීමට උදවු වනු පිණිස රබාත් ක්‍රියාකාරී සැලසුම (Rabat Plan of Action) පහත දැක්වෙන කරුණු හය ලැයිස්තුගත කර තිබේ.

*පසුබිම: යම්කිසි ප්‍රකාශයක් හරහා ඉලක්ක කණ්ඩායමට එරෙහිව වෙනස්කොට සැලකීම, එදිරිවාදිකම හෝ ප්‍රචණ්ඩත්වය අවුළුවාලීමට ඉඩ තිබේදැයි තක්සේරු කිරීමේදී එම ප්‍රකාශය කරන්නේ කුමන පසුබිමකදැයි යන්න ඉතාමත් වැදගත් වන අතර, අභිප්‍රාය සහ/හෝ හේතුව සඳහා ද එය සෘජුවම බලපායි. පසුබිම විශ්ලේෂණය කිරීමේදී, අදාළ කථනය සිදුකළ හා බෙදාහරිනු ලැබූ වේලාවේ පැවති සමාජ හා දේශපාලන පසුබිම තුළ එම කථනය සලකා බැලිය යුතුවේ;*

*කථිකයා: අදාළ කථිකයා සමාජයේ දරන ස්ථානය නොහොත් තරාතිරම සලකා බැලිය යුතු වේ. විශේෂයෙන්ම අදාළ කථනයෙන් ආමන්ත්‍රණය කරන ප්‍රේක්ෂක පිරිස අතරේ එම පුද්ගලයාට හෝ සංවිධානයට ඇති ස්ථානය කුමක්දැයි සලකා බැලිය යුතු ය;*

*අභිප්‍රාය: සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතියේ 20වැනි වගන්තියෙන් අභිප්‍රාය පූවර්‍රාපේක්ෂා කරනු ලැබේ. සම්මුතියේ20 වැනි වගන්තිය යටතේ වරදක් ලෙස සලකනු ලැබීමට නම්, යම් ක්‍රියාවක් නොසලකාහැරීමක් හා අනවධානයෙන් ක්‍රියාකිරීමක් වීම ප්‍රමාණවත් නොවේ. එම වගන්තියෙන් විධිවිධාන සලසා ඇත්තේ "උද්දේශනය" හා "අවුළුවාලීම" සඳහා මිස යම් ලේඛනයක් හෝ පණිවුඩයක් බෙදාහැරීම හා සංසරණය සඳහා නොවේ. මෙහිදී, අරමුණ, කථන විෂයය සහ ප්‍රේක්ෂකයා යන පාශර්වයන් අතර තුන්කොන් සබඳතාවයක් සක්‍රියනය වීම අවශ්‍ය වේ.*

*අන්තගර්තය හා ආකෘතිය: අවුළුවාලීම නොහොත් පෙළඹවීම යන්න සඳහා අත්‍යාවශ්‍ය අංගයක් වන මෙය, අධිකරණයේ විචාරයට ගැනෙන කරුණු අතරේ කේන්ද්‍රස්ථානයක් ගන්නා කරුණකි. අදාළ කථනය කොතෙක් දුරකට කුපිතකරවනසුළු වී ද සහ සෘජු වී ද යන්න මෙන්ම කථනයේදී යොදාගත් ආකෘතිය, රටාව, භාවිතා කළ තකර්වල ස්වභාවය හෝ භාවිතා කළ තකර් අතර සමබරතාවය යනාදිය ද අන්තගර්තය විශ්ලේෂණය කිරීමේදී ඇතුළත් විය විය හැකිය;*

*කථනයේ තරම: කථනයේ තරම යන්නට එම කථනය කොතරම් පැතිරුණේද, එය කොතරම් ප්‍රසිද්ධියේ සිදුකර තිබේද, එහි ප්‍රමාණය සහ ප්‍රේක්ෂක පිරිසේ විශාලත්වය යනාදී අංග ඇතුළත් වේ. මෙහිදී සලකා බැලියයුතු අනෙකුත් අංග අතරට එම කථනය ප්‍රසිද්ධියේ කරන ලද්දක් ද, එය බෙදාහැරීමට යොදාගෙන ඇති ක්‍රම මොනවාද- උදාහරණ වශයෙන් තනි අත්පත්‍රිකාවක් බෙදාහැර ඇත් ද නැතහොත් අන්තජර්ාලය හෝ ප්‍රධාන ධාරාවේ මාධ්‍ය හරහා ප්‍රචාරණය කර ඇත්ද, එය සිදුව ඇති වාරගණන කොපමණ ද, සිදුව ඇති සන්නිවේදන සංඛ්‍යාව සහ කොතරම් දුරකට ද යනවග, එම පෙළඹවීම අනුව ක්‍රියාත්මක වීමට ප්‍රේක්ෂකයාට හැකියාව තිබුණේද, අදාළ ප්‍රකාශය (හෝ ලේඛනය) සංසරණය වන්නේ සීමා සහිත පරිසරයක ද, නැතහොත් මහජනතාවට ඒ වෙත පුළුල් ලෙස ප්‍රවේශ වියහැකිද යනාදිය ඇතුළත් වේ;*

*වහා සිදුවීම ඇතුළුව සිදුවන්නට හැකිබව: පෙළඹවීම නොහොත් අවුළුවාලීම නිවර්චනය කර ඇත්තේ අසම්පූර්ණ අපරාධයක් වශයෙන් ය. අවුළුවාලනසුළු කථනයක් හරහා උද්දේශනය කළ ක්‍රියාව සැබැවින්ම සිදුකර තිබීම, එම කථනය අපරාධයක් ලෙස හඳුනාගැනීම සඳහා අවශ්‍ය නොවේ. කෙසේනමුත්, යම් මට්ටමක හානි අවදානමක් හඳුනාගැනීම මෙහිදී අවශ්‍ය වේ. එනම්, එම හේතුඵල සම්බන්ධය සෘජු වියයුතු බවද හඳුනාගැනීමට ලක් කරමින්, අදාළ කථනයෙන් ඉලක්ක කණ්ඩායමට එරෙහි ක්‍රියාවන් සිදුකිරීම සඳහා සාථර්කව පෙළඹවීමට සාධාරණ සම්භාවිතාවයක් තිබුණේද යන්න අධිකරණයෙන් තීරණය කළයුතු වේ.*[20]

සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුති පනතේ 3වැනි වගන්තිය සම්බන්ධයෙන් සිදුකළ නෛතික විග්‍රහයක දී ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව (HRC) එම විධිවිධානය යොදාගතයුත්තේ කෙසේද යන්න පිළිබඳ නිදෙර්ශ ඉදිරිපත් කර තිබේ.[21] HRC හි එම විශ්ලේෂණය සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතියේ (ICCPR) 20වැනි වගන්තිය මත පදනම් වී තිබේ. එහි තකර් කෙරෙන්නේ සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුති පනතේ 3වැනි වගන්තිය ඉහත කී ICCPR 20වැනි වගන්තිය මත සහ රබාත් ක්‍රියාකාරී සැලසුමේ විශ්ලේෂණයක් මත පදනම් වී ඇති බවකි. මෙම විෂයය සම්බන්ධයෙන් ඇති ජාත්‍යන්තර නීති මීමංසා සලකා බලමින් සහ රබාත් ක්‍රියාකාරී සැලසුමේ ඇතුළත් සය-වැදෑරුම් සීමා පරීක්ෂණය අනුව සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුති පනතේ 3වැනි වගන්තිය අථර් නිරූපණය කළයුතු බව HRC නිදෙර්ශ කරයි. 3වැනි වගන්තිය යටතේ වෛරය උද්දේශනය  කිරීම තහනම් කළ යුත්තේ වෙනස්කොට සැලකීම, එදිරිවාදිකම හෝ ප්‍රචණ්ඩත්වය සිතාමතාම අවුළවීමක් වශයෙන් එය සැලකියහැකි නම් පමණක් බව ඉන් තවදුරටත් නිදෙර්ශ කරයි. එසේම, 3වැනි වගන්තිය යනු තනිව අදාළ කරගතයුතු විධිවිධානයක් නොවන අතර, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ඇතුළත් ප්‍රකාශනයේ නිදහස සඳහා වන අයිතිය අනුව එය අථර් නිරූපණය කළයුතු වේ.[22]

මෙම අධ්‍යයනයේදී අන්තජර්ාලය තුළ අන්තගර්තය සෙවුමේ දී, වෛරී කථනය සම්බන්ධයෙන් වන පහත දැක්වෙන නිවර්චනයෙන් මගපෙන්වුම් ලබන ලදී:

*ජාතිය, වාගර්ිකත්වය, ආගමික සම්බන්ධතාවය, ලිංගික දිශානතිය, කුලය, ලිංගය, ස්ත්‍රීපුරුෂ සමාජභාවය, ස්ත්‍රීපුරුෂ සමාජභාවී අනන්‍යතාවය හෝ ආබාධිතභාවය මත පදනම් වෙමින් පුද්ගලයකු හෝ කණ්ඩායමකට එල්ල කරන සෘජු ප්‍රහාරයක්. මීට, ප්‍රචණ්ඩකාරී හෝ මිනිසත්කම සිඳින හෝ අපහාසාත්මක කථනය, පහත් යැයි කරනු ලබන ප්‍රකාශ, බැහැර කිරීමට හෝ වෙන් කිරීමට කීම, නිශ්චිත කණ්ඩායමක් හෝ පුද්ගලයකු වෙත ප්‍රචණ්ඩත්වය යොමුකිරීමට කීම, සහ ප්‍රචණ්ඩත්වය වෙනුවෙන් උද්දේශනය හා පෙළඹවීම ඇතුළත් වේ.*

---


20 UNGA, 'Annual Report of the United Nations High Commissioner for Human Rights: Addendum – Report of the United Nations High Commissioner for Human Rights on the Expert Workshops on the Prohibition of Incitement to National, Racial or Religious Hatred' (11 January 2013) UN Doc A/HRC/22/L7/Add.4, at www.ohchr.org/Documents/Issues/Opinion/SeminarRabat/Rabat_draft_outcome.pdf.

21 Human Rights Commission of Sri Lanka, 'The Human Rights Commission of Sri Lanka's (HRCSL) Analysis of the Scope of Section 3 of the ICCPR Act No 55 of 2007 and Attendant Guidelines' *Sri Lanka Brief* (29 August 2019) at www.srilankabrief.org/2019/09/sri-lankas-hrcsl-provides-its-analysis-of-the-scope-of-section-3-of-the-iccpr-act-in-the-context-of-recent-abuses-of-the-act/.

22 ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 14 (1)(අ) වගන්තියෙන් ප්‍රකාශනයේ නිදහස සඳහා වන අයිතිය ආරක්ෂා කර දී තිබේ. තවද Centre for Policy Alternatives, '*Confronting Accountability for Hate Speech in Sri Lanka: A Critique of the Legal Framework*' (2018) බලන්න.


## සොයාගත් කරුණු

මාතර්ු මාසයේ සිට ජූනි මාසය දක්වා මාස තුනක කාල සීමාවක් තුළ පෝස්ටු, ට්වීට් සහ කොමෙන්ටු 103ක් හඹාගිය අතර ඉන් 53ක් සිංහල භාෂාවෙන් වූ අතර 50ක් දෙමළ භාෂාවෙන් විය. මෙම පෝස්ටු, ට්වීට් හා කොමෙන්ටු අතරින් බහුතරය මුස්ලිම් ජනතාව ඉලක්ක කරගත් ඒවා වුවද, ක්‍රිස්තියානි ජනතාවට පහර එල්ල කරන ඒවා ද විශාල සංඛ්‍යාවක් තිබුණි. 2009 වෂර්යේ යුද්ධය අවසාන වීමෙන් අනතුරුව මුස්ලිම්-විරෝධී වෛරී කථනය වධර්නය වූ අතර, 2019 පාස්කු ඉරිදා ප්‍රහාරවලින් පසුව එය බොහෝ ඉහළ ගියේ ය. සමීක්ෂණයට ලක් කළ පෝස්ටු 103න් 60ක් (58%) විවිධ හේතු මත මුස්ලිම් ජනතාව හෝ ඉස්ලාම් ආගමට පහර ගසන ඒවා විය. පෝස්ටු අතරින් 31ක් (30%) ක්‍රිස්තියානි ජනතාවටත් පහක් දෙමළ ජනතාවට හෝ ඉන්දු ආගමටත් පහර ගසන ඒවා විය.




## සිංහල බසින් වූ පෝස්ටු

සමීක්ෂණයට ලක් කළ, සිංහල බසින් වූ පෝස්ටු අතරින් විශාල සංඛ්‍යාවක් මුස්ලිම් ජනතාවට පහර එල්ල කරන පෝස්ටු විය. සමීක්ෂණය කළ සිංහල පෝස්ටු 53න් 42ක් (සියයට 79.2) මුස්ලිම් ජනතාව හෝ ඉස්ලාම් ආගමට එරෙහිව සිදුකළ හෙලා දැකීම් වේ. අනෙක් අතට, අන්තජර්ාලය තුළ දෙමළ බසින් සිදුකළ පහර එල්ල කිරීම් සම සේ මුස්ලිම් සහ ක්‍රිස්තියානි ජනතාවට එරෙහිව සිදුකර තිබුණි. සමීක්ෂණය කළ, දෙමළ බසින් වූ පෝස්ටු 50න් 23ක් දෙමළ ජනවගර්යට අයත් ක්‍රිස්තියානි බැතිමතුන්ට පහර දුන් අතර (46%) පෝස්ටු 18ක් මුස්ලිම්වරුන් හෝ ඉස්ලාම් ආගමට පහර දුනි (35%).





මුස්ලිම් ජාතිකයින්ට පහර දුන්, සිංහල බසින් වූ පෝස්ටු, 'පොදු' ස්වභාවයක් ගන්නා පෝස්ටු සහ කෝවිඩ්-19 වසංගතය හා බැඳුනු පෝස්ටු යන දෙවගර්යේම සම්මිශ්‍රණයක ස්වභාවයක් ගත්තේ ය. එහි වූ 'පොදු' ස්වභාවයේ පෝස්ටු, ගතවූ වසර ගණනාවක් තිස්සේ සමාජ මාධ්‍ය තුළ වූ වෛරී කථනයෙහි කොටසක් වූ මුස්ලිම් ජනතාවට එරෙහි ඒකාකෘතිකරණ, මිථ්‍යා, සහ සිතාමතා ම වැරදි තොරතුරු ප්‍රචාරණය තවදුරටත් ඉදිරියට පවත්වාගෙන යාමක් විය. කෙසේනමුත්, වඩාත් පොදු ස්වභාවයක් ගත් කොමෙන්ටු, කෝවිඩ්-19 හා සබැඳි විශේෂිත කොමෙන්ටුවලට වඩා පුළුල් ලෙස හා වැඩි ව්‍යාප්තියකින් යුතුව බෙදාහදාගෙන තිබිණි. මියන්මාරයේ මුස්ලිම්වරුන් විසින් බෞද්ධ හිමිනමකගේ හැඩරුවට සකසන ලද පඹයකු පුළුස්සන රූපයක් සහ ඔවුන් මෙරට ජනගහනයෙන් භාගය දක්වා වධර්නය වූ පසුව මෙය ශ්‍රී ලංකාවේ සිදුවනු ඇතැයි අනතුරු ඇඟවීමක් සහිත පෝස්ටුවක් එක් පුද්ගලයකු විසින් පල කළ තිබූ අතර එය 10,000ක් විසින් ෂෙයාර් නොහොත් තවත් අය සමගින් බෙදාහදාගැනීම සිදුකර තිබුණි. තවත් අයෙකු විසින් පලකර තිබූ, රොහින්‍යා මුස්ලිම්වරුන් මෙරටට අනවශ්‍ය බවත් ඔවුන් මරාදැමිය යුතු බවත් සඳහන් වූ පෝස්ටුවක්, අදාළ සමාජමාධ්‍ය වේදිකාව මත 9,000 වරකට ආසන්න ප්‍රමාණයකින් ෂෙයාර් වී තිබුණි. ඊට සමාන, මුස්ලිම්වරුන්ට ගුටිබැට දියයුතු හා පහර දියයුතු බවක් කියැවෙන තවත් පෝස්ටුවක් එක්තරා කණ්ඩායමක (Group) පල කර තිබූ අතර ඊට 'ලයික්' 2,400ක් ලබා දී තිබූ අතර එය 950ක් වරක් ෂෙයාර් වී තිබුණි. ඉස්ලාම් දහමට නිග්‍රහ කරන සහ මුස්ලිම්වරුන් පුළුස්සා දැමිය යුතු බව කියැවෙන පෝස්ටුවක් කණ්ඩායමක පල වී තිබූ අතර, එය 1,200 වරක් ෂෙයාර් වී තිබුණි.




2019 අප්‍රේල් මාසයේදී මුස්ලිම්වරුන් විසින් බෝම්බ ගෙනයන කාටුනයක් සහ 2020 දී මුස්ලිම්වරුන් විසින් වෛරසය ගෙනයන කාටූනයක් යන කාටූන් දෙක වසංගතය හා සබැඳි පෝස්ටු කෙබඳු දැයි පෙන්නුම් කරයි. තවද, මාතර් හා අප්‍රේල් මාසවල පල වූ පෝස්ටු කිහිපයකම මුස්ලිම්වරුන් පිළිබිඹු කර තිබුණේ වසංගතය පතුරුවන්නන් ලෙසින් වන අතර, ඒවායෙහි මුස්ලිම් ප්‍රජාවට එරෙහිව පරිහවාත්මක යෙදුම් භාවිතා කර තිබුණි. 1,000 වරකට වඩා ෂෙයාර් වූ සහ කොමෙන්ටු 200කට වඩා ලබා තිබුණු එක් පෝස්ටුවක මෙරට සිංහල ජාතික අධිකරණ අමාත්‍යවරයෙකු නැත්තේ ඇයිදැයි විමසා තිබුණි.

ස්විස් ජාතික පාදිලිතුමාට පහර දුන් එක් පෝස්ටුවක් සිංහල බසින් වූ අතර, එය පහත සාකච්ඡාවට ගෙන තිබේ. වඩාත් 'පොදු' ස්වභාවයක් ගත් තවත් පෝස්ටු කිහිපයක් වූ අතර, ඒවායෙහි වසංගතය සම්බන්ධයෙන් විශේෂයෙන් සඳහන් නොකර ක්‍රිස්තියානි ආගමේ ඇතැම් සම්ප්‍රදායන් හෝ විශ්වාස විසුළුවට ලක් කර තිබුණි. පෝස්ටු කිහිපයක ක්‍රිස්තියානි ආගම "විදෙස් ආගමක්" වශයෙන් හඳුන්වා දී තිබූ අතර, ක්‍රිස්තියානි ජනතාව "සිංහල බෞද්ධ සංස්කෘතිය මංකොල්ලකන්නන්" වශයෙන් හඳුන්වා දී තිබුණි. මෙහිදී විශේෂයක් වන්නේ, මේ පෝස්ටු තුළ කතෝලික, ප්‍රොතෙස්තන්ත්‍ර, හෝ ඉවැන්ජලික ක්‍රිස්තියානි බැතිමතුන් වශයෙන් නිකාය අනුව ක්‍රිස්තියානි බැතිමතුන් වෙන්කර හඳුනාගැනීමක් නොතිබීමයි.




## භූමදාන චාරිත්‍ර සම්බන්ධ මතභේදය

මාතර්ු මස අගභාගයේදී හා අප්‍රේල් මුල් කාලයේදී, කෝවිඩ්-19 රෝගයෙන් මියයන තැනැත්තන්ගේ මළසිරුරු බැහැර කරන අන්දම පිළිබඳ මතභේදයක් ඇතිවිය. මේ ආසන්න කාලයේදී සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් මේ කාරණාව පිළිබඳව එකිනෙකට පටහැනි චක්‍රලේඛ නිකුත්කර තිබුණි. 2020 නොවැම්බර් මස 25වැනි දාතම දරන ලිපියකින් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව, “කෝවිඩ්-19 රෝගයෙන් මියගිය හෝ කෝවිඩ්-19 රෝගයෙන් මියගිය බවක් සැක කරන තැනැත්තන්ගේ සිරුරු ආදාහනය අනිවාර්ය කිරීම මහජන සෞඛ්‍ය ආරක්ෂා කරගැනීම සඳහා අවශ්‍ය හෝ සමානුපාතික නොවේ. එබැවින් එය ආගම හෝ විශ්වාස ප්‍රකට කිරීම සීමාකිරීමට අවසර දිය හැකි තත්වයක් නොවේ.”[23] එක් චක්‍රලේඛයක සඳහන් කර තිබුණේ මරණය සිදු වූ අවස්ථාවල භූමදානය පිළිගත හැකි බවක් වන අතර, පසුව නිකුත් වූ චක්‍රලේඛයක ප්‍රකාශ කර තිබුණේ මරණය සිදුවුවහොත් සියළුම මළසිරුරු භූමදානය නොව ආදාහනය කළයුතු බවත් ය.[24] මුස්ලිම්වරුන් කරන්නේ මියගිය තැනැත්තන් භූමදාන කිරීම වන අතර ආදාහනය, ශ්‍රී ලංකාවේ මුස්ලිම් ජනතාව අනුගමනය කරන ප්‍රධාන ප්‍රවාහයේ ප්‍රගුණකිරීම් අතරට ඇතුළත් නොවේ. ආගමික සම්ප්‍රදාය කුමක් වුවත් සියළු මළසිරුරු ආදාහනය කළයුතු යැයි කියා සිටින පෝස්ටුවක් 31,000 ඉක්මවන වාර ගණනක් ෂෙයාර් කර තිබුණි. තවත් පෝස්ටු තුළින් ද මෙම චාරිත්‍රයට පහර දෙමින් ආගම කුමක් වුවත් වෛරසයෙන් මියයන තැනැත්තන් ආදාහනය කළයුතු බව සඳහන් කර තිබුණි.


## දෙමළ බසින් වූ පෝස්ටු

---

[23] Human Rights Commission of Sri Lanka, ‘HRCSL observations and recommendations on Extraordinary Gazette No.2170/8 dated 11th April 2020’ (25 November 2020) at https://www.hrcsl.lk/wp-content/uploads/2020/02/Observations-Recommendations-Disposal-Dead-Bodies-Covid19_compressed.pdf


[24] National Christian Evangelical Alliance of Sri Lanka, ‘*Sri Lanka’s Public Health Response: Law, Executive Action and Minority Rights*’, (Sep 2020) p 15 – 16 බලන්න.

සිංහලෙන් වූ පෝස්ටු හා කොමෙන්ටු ප්‍රධාන වශයෙන්ම මුස්ලිම්වරුන් ඉලක්ක කර තිබුණ ද, දෙමළ බසින් වූ පෝස්ටු සම සමව මුස්ලිම් ජනතාව සහ ක්‍රිස්තියානි ජනතාව වෙත පහර එල්ල කර තිබුණි. දෙමළ බසින් වූ පෝස්ටු 50 අතරින් පෝස්ටු 23ක් (46%) දෙමළ ජනවගර්යට අයත් ක්‍රිස්තියානි ආගමිකයින්ට පහර එල්ල කරන ඒවා වූ අතර පෝස්ටු 18ක් (35%) මුස්ලිම් ජනතාව හෝ ඉස්ලාම් ආගමට පහර එල්ල කරන ඒවා විය. පෝස්ටු හතරකින් හින්දු ආගමට පහර එල්ල කර තිබූ අතර බෞද්ධ ජනතාවට පහර එල්ල කරන එක් පෝස්ටුවක් ද වාගරීක යුද්ධය කාලයේ මිනිමැරුම් ගණනාවකට වරදකරු වූ හමුදා නිලධාරියකු නිදහස් කිරීම සම්බන්ධයෙන් පහර එල්ල කරන එක් පෝස්ටුවක් ද විය.




දෙමළ ජනතාවට පහර එල්ල කරන, දෙමළ භාෂාවෙන් වූ පෝස්ටු ප්‍රධාන කාණ්ඩ තුනකට අයත් විය. ඒවා නම්, හින්දු ආගම යක්ෂයකු මෙන් පිළිබිඹු කරන පෝස්ටු; ක්‍රිස්තියානි ආගමට මාරු වූ හින්දු ආගමිකයින් විසුලුවට ලක් කරන පෝස්ටු ඇතුළුව පොදුවේ ක්‍රිස්තියානි ආගමිකයින්ට අපහාස කරන පෝස්ටු; සහ ස්විස් ජාතික පාදිලිතුමාට සහ ඔහුගේ නිකායේ අනුගාමිකයින්ට පහර එල්ල කරන පෝස්ටු වේ. පෝස්ටු හා කොමෙන්ටු බොහොමයක් ස්විස් ජාතික පාදිලිතුමාගේ සංචාරය හා සම්බන්ධ වූ ඒවා වන අතර, මීළඟ කොටසින් එය සාකච්ඡාවට ගෙන තිබේ.

මුස්ලිම්වරුන්ට පහර දෙන පෝස්ටු ද පුළුල් කාණ්ඩ තුනකට අයත් විය. එක් පෝස්ටු කට්ටලයකින් පොදුවේ ඉස්ලාමය ආගම යක්ෂයකු මෙන් පිළිබිඹු කළේය. තවත් කට්ටලයක් වෛරසය හේතුවෙන් මියගිය අයගේ භූමදාන චාරිත්‍ර සහ මළ සිරුරු බැහැර කිරීම පිළිබඳව අදහස් දැක්වීය. තෙවන කාණ්ඩය පාස්කු ඉරිදා බෝම්බ ප්‍රහාරයේ ප්‍රචණ්ඩත්වය මත පදනම් විය. ඒ හා සමාන සිංහල භාෂා පෝස්ටු ප්‍රතිරාවය කරමින් එක් පෝස්ටුවක් 2019 දී මුස්ලිම් පල්ලි ආයුධ ගබඩාවක් ලෙසත් 2020 දී වෛරසයේ ගබඩාවක් ලෙසත් නිරූපණය කර තිබුණි.




මාතර්ථ මස අවසානයේදී සහ ඇදිරි නීතිය ක්‍රියාත්මක වන අතරතුර ජනාධිපතිවරයා සමාව දීමේ ව්‍යවස්ථාමය බලතල යොදාගනිමින් ජනවාගරීක යුද්ධයේදී බහුවිධ ඝාතන සම්බන්ධයෙන් වැරදිකරු වූ හමුදා නිලධාරියෙකු නිදහස් කළේ ය. අදාළ නිලධාරියා විවිධ අපරාධ සම්බන්ධයෙන් මහාධිකරණය විසින් වරදකරු කරනු ලැබූ අතර තමන් වරදකරු කිරීමට එරෙහිව ශ්‍රේෂ්ඨාධිකරණයට ඉදිරිපත් කළ අභියාචනය ඔහු පරාජය විය. එය 2009 දී අවසන් වූ යුද්ධය අතරතුර සිදු වූ අපරාධ සඳහා දඬුවම් ලබා දුන් දුලර්භ අවස්ථාවක් විය. දෙමළ භාෂාවෙන් වූ එක් පෝස්ටුවකින් ජනාධිපතිවරයාගේ ක්‍රියාව විවේචනය කළ අතර සිංහලයන් වෛරසයට වඩා යක්ෂයෙකු බව නිරීක්ෂණය කළේය.

## ස්විස් පාදිලිතුමා සම්බන්ධ සිදුවීම

'ස්විස් පාදිලිතුමා' සමාජ මාධ්‍ය තුළ විවිධ පෝස්ටු හා කොමෙන්ටුවල විෂයය වූ අතර විශේෂයෙන්ම දෙමළ බසින් වූ පෝස්ටු ඒ අතර විය. දෙමළ අනන්‍යතාවයක් සහිත ස්විස් පාදිලිතුමකු මාතර්ථ මාසයේදී ශ්‍රී ලංකාවේ සංචාරය කරමින් යාපනය ඇතුළු දිවයිනේ උතුරු ප්‍රදේශවල ආගමික මෙහෙය පවත්වා තිබේ. ආපසු ස්විට්සලර්න්තයට ගිය විට, ඔහුට කෝවිඩ්-19 වැළඳී ඇති බව පරීක්ෂාවෙන් සනාථ වූ අතර ශ්‍රී ලංකාවේ දී ඔහු හා සම්බන්ධ වූ අය වෙන්කර වෛරස පරීක්ෂාවට භාජනය කරන ලදී.

මෙම පාදිලිතුමා සහ ඔහු අයත් ඉවැන්ජලික නිකායේ අනුගාමිකයින් වෙත පහර එල්ල කරන පෝස්ටු ගණනාවක් ම මේ සිදුවීම හේතුවෙන් මතු වූ අතර, දෙමළ භාෂාවෙන් වූ වෙබ් අඩවිවල ඒවා පුළුල්ව ෂෙයාර් කෙරිණි. සමීක්ෂණයට ලක් වූ, දෙමළ භාෂාවෙන් වූ පෝස්ටු හා කොමෙන්ටු 50 අතරින් 17ක් මෙම පාදිලිතුමාට, ඔහු අයත් නිකායට සහ ඔහුගේ අනුගාමිකයින්ට පහර එල්ල කරන පෝස්ටු විය. එකී නිකායට අයත්වන කාන්තාවන් සදාචාරය අතින් චපල තැනැත්තියන් වශයෙන් පිළිබිඹු කරන පෝස්ටු දෙකක් විය. එක් පෝස්ටුවක් සඳහා ලබාදී තිබූ කොමෙන්ටුවක ස්විස් පාදිලිතුමා සහ ඔහුගේ දේවස්ථාන සාමාජිකයින් "තුරන් කර දැමිය යුතු වෛරස" වශයෙන් හඳුන්වා තිබුණි. කෙසේනමුත්, මෙම ස්විස් පාදිලිතුමා පිළිබඳව සඳහන් වූයේ සිංහල පෝස්ටු අතරින් එකක පමණක් විය. සිංහල භාෂාවෙන් වූ පෝස්ටු බොහොමයක වෛරසය පතුරුවන්නන් වශයෙන් මුස්ලිම් ජනතාව නිරූපණය කර තිබුණාක් හා සමානව, දෙමළ බසින් වූ පෝස්ටුවල හඟවා තිබුණේ ක්‍රිස්තියානි ආගමිකයින් කෝවිඩ්-19 පතුරුවන්නන් බවකි.

யாழ்ப்பாண நாயகன்

Send Message | Like

Like · Reply · 25 w

கூழ்முட்டை அடி முட்டாள்கள்

2

Like · Reply · 25 w

இவர்கள் தங்கள் தாய் தகப்பன் பெயரை மறந்து வாழ்பவர்கள்

1

Like · Reply · 25 w

அடியோடு அழிக்கவேண்டிய கிருமிகள்

2

Like · Reply · 25 w

"Most relevant" is selected, so some comments may have been filtered out.

## නිගමන

තුන් මාසයක කාලසීමාක් තුළ සමීක්ෂණය කළ මෙම පෝස්ටු සහ කොමෙන්ටු 103 හරහා, ආගමික සුළුතර කණ්ඩායම්වලට එරෙහිව සමාජ මාධ්‍ය තුළ මින් පෙර එල්ල වූ ප්‍රහාරවල නැඹුරුව ම පිළිඹිබු වේ. විශේෂයෙන්ම, මුස්ලිම් ජනතාව, ක්‍රිස්තියානි ජනතාව සහ හින්දු ජනතාව සමාජ මාධ්‍ය හරහා දිගින් දිගටම යක්ෂයින් සේ පිළිබිඹු කරමින් තිබේ. මෙම තුන් මාසය තුළ නිරීක්ෂණය කළ බොහෝ පෝස්ටු සහ කොමෙන්ටු හරහා නිරූපණය වූයේ මින් පෙර සමාජ මාධ්‍ය තුළ ප්‍රකාශනය වූ අන්දමේ ම සිතාමතා සිදුකරන බොරු ප්‍රචාර, ඒකාකෘතිකරණ සහ යක්ෂයින් මෙන් පෙන්නුම් කිරීම යන හැසිරීම් වේ. තවද, වසංගතය හා බැඳුනු විශේෂ සිදුවීම් අළලා සැකසුනු නව පෝස්ටු ද දක්නට තිබුණි.

ලෝක සෞඛ්‍ය සංවිධානයෙන් නිකුත්කළ මාගෙර්පදේශයන්හි, කෝවිඩ්-19 වෛරසය හේතුවෙන් මියගිය තැනැත්තන්ගේ සිරුරු භූමදානය සඳහා අවසර දී ඇතත් මුස්ලිම් ජනතාවගේ භූමදාන චාරිත්‍ර හෙලා දැකීමට ලක් කර තිබේ. උතුරු පළාතේ සංචාරය කළ, සහ වෛරසය ආසාදනය වී ඇතිබව පරීක්ෂාවෙන් සනාථ වූ දෙමළ ජනවාගරීක ස්විස් පාදිලිතුමා හේතුවෙන් වෛරී පෝස්ටු සහ කොමෙන්ටු ගණනාවක් උත්පාදනය වී තිබේ. 2019 පාස්කු බෝම්බ ප්‍රහාරවලින් පසුව ඇතිවූ වෛරී කථනය දිගින් දිගටම පවත්වාගෙන යන සැටියක්, 2019 දී ත්‍රස්තවාදය පතුරුවන්නන් වශයෙන් නිරූපණය වූ මුස්ලිම් ජනතාව 2020 දී වෛරසය පතුරුවන්නන් වශයෙන් නිරූපණය කිරීම තුළින් පෙන්නෙනට තිබේ. විශේෂයෙන්ම සිංහල බසින් වූ පෝස්ටු තුළ මුස්ලිම් ජනතාව කෙරෙහි එල්ල වූ මෙම හැඟීම පැහැදිලිවම හඳුනාගත හැකි වූ අතර, දෙමළ බසින් වූ පෝස්ටු හරහා මුස්ලිම් සහ ක්‍රිස්තියානි යන දෙකොටසටම පහර එල්ල කර තිබුණි. කතෝලික කාදිනල්තුමාට පහර එල්ල කළ සිංහල පෝස්ටු දෙකක් තිබිණි. සිංහලෙන් වූ පෝස්ටු 53න් එකක හෝ සිංහල ජනතාව හෝ බුද්ධාගම පිළිබඳ අදහස් පලකර නොතිබූ අතර, එක් පෝස්ටුවක පමණක් අනෙක් ආගම්වලට ගරුකිරීමක් බුද්ධාගමේ නියම කර නොමැති බවක් සඳහන් වී තිබුණි. දෙමළ බසින් වූ පෝස්ටු 50න් දෙකක සිංහල බෞද්ධයින් හෙලා දැක තිබූ අතර මරණ දඬුවම නියම වී තිබූ සිරකරුවකු නිදහස් කරගැනීම පිළිබඳ පෝස්ටුව ද ඊට ඇතුළත් විය. 2019 පාස්කු ඉරුදින ප්‍රහාර වේවා, 2020 වසංගත තත්වය වේවා, අබර්ුදකාරී අවස්ථා පැනනැගුනු කල අවස්ථාවාදී ලෙස කටයුතු කරන වෛරයට පොළඹවන්නන් අන්තජර්ාලය හරහා වෛරය වැපිරවීමට යොමුවන බවකි.

වරද සඳහා දඬුවම් නොලැබීම, ශ්‍රී ලංකාවේ පවතින එක් ප්‍රශ්නයකි. මානව හිමිකම් උල්ලංඝන අතලොස්සක් පමණක් නඩුපැවරීමට ලක් වූ 26 වසරක සිවිල් යුද්ධය අතරතුර දී වරද සඳහා දඬුවම් නොලැබීම යන්න ප්‍රශ්නයක් විය. යුද්ධය අවසාන වී වංචල ස්වභාවයේ වාගරීක-ආගමික පරිසරයක් මතුවී ඇති තත්වය තුළ ද එය තවදුරටත් ප්‍රශ්නයක් ලෙස පවතියි. ඉහත සඳහන් වූ, ආගම ඇදහීමේ හෝ විශ්වාස දැරීමේ නිදහස පිළිබඳ විශේෂ නියෝජිත විසින් සිදුකළ නිරීක්ෂණයන්හි සඳහන් වී ඇති පරිද්දෙන් වරදකරුවන්ගේ අනන්‍යතාවය සහ ඔවුන් සිදුකළ ක්‍රියාවන් පිළිබඳව ප්‍රසිද්ධ තලයෙන් ලබාගත හැකි, පිළිගත හැකි බවක් පෙනෙන සාක්ෂි තිබියදී පවා වෛරී කථනය සහ ආගමික ප්‍රචණ්ඩත්වය යන දෙකම විමශර්නයට හා නඩුපැවරීමට ලක් වී නොමැත. වෛරී කථනය සම්බන්ධයෙන් ගත් කල, නීතිය තෝරාබේරා අදාළ කරගැනීම තුළින් මුස්ලිම් ජනතාව රඳවා තබාගැනීමට යොදාගෙන තිබේ. මෙකී අත් අඩංගුවට ගැනීම් හා රඳවා තබාගැනීම්වලින් පසුව, ඒවා සම්බන්ධයෙන් අපක්ෂපාතී විමශර්නය සිදුව නොමැති අතර, නඩුපැවරීමේ කටයුතු සාථර්කව නිමා කර නොමැත.[25]

---

[25] ඔහු විසින් ලියා අන්තජර්ාලයේ පලකළ ප්‍රබන්ධ කෙටිකථාවකින් බුද්ධාගමට අපහාස කෙරෙතැයි යන පදනමින් අත් අඩංගුවට ගත් ශක්තික සත්කුමාර පිළිබඳ සිදුවීම බලන්න. ඔහුව රඳවා තබාගැනීම අත්තනෝමතික රඳවාතබාගැනීමක් බව එක්සත් ජාතීන්ගේ අත්තනෝමතික රඳවාගැනීම් සම්බන්ධයෙන් වන ක්‍රියාකාරී කණ්ඩායම හඳුනාගන්නා ලදී, UNHRC Working Group on Arbitrary Detention, 'Opinion No 8/2020 Concerning Delankage Sameera Shakthika

ආගම ඇදහීමේ හා විශ්වාස දැරීමේ නිදහස පිළිබඳව විශේෂ නියෝජිතවරයා ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් මෑතක දී නිකුත් කළ තම වාතර්ාවේ මෙසේ නිරීක්ෂණ කර තිබේ:

> *ශ්‍රී ලංකාවේ නීති රාමුවෙන් සියළුම දෙනාට ආගම ඇදහීමේ හෝ විශ්වාස දැරීමේ නිදහස සහතික කර දී ඇතත්, ප්‍රායෝගිකව ගත් කළ මෙම අයිතිවාසිකම් භුක්ති විඳීම සඳහා අභියෝග කිහිපයක්ම තිබේ. තමන්ගේ ආගම හෝ විශ්වාස ප්‍රකට කිරීමේදී ආගමික සුළුතර කණ්ඩායම් සීමාකිරීම්වලට මුහුණ දෙති; ඔවුන්ගේ ආගමික ස්ථාන කෙලෙසීමට ලක් වන අතර වන්දනා මෙහෙයන් වැනි ඔවුන්ගේ ආගමික ක්‍රියාකාරකම් රටේ ජනතාව සහ බලධාරීන්ගේ බාධා පැමිණවීම්වලට ලක් වේ. සුළුතර ආගමික ප්‍රජාවන්ට අළුතින් ආගමික ස්ථාන ඉදිකිරීම දුෂ්කර වී ඇති අතර, අත්තනෝමතික ලෙස නියම කළ ලියාපදිංචි කිරීමේ නියමයන් හේතුවෙන් ඇතැම් ආගමික ස්ථාන නොකැමැත්තෙන් හෝ වසා දමන්නට සිදුවී තිබේ. 'ආචාරධමර් විරෝධී අන්දමින් ආගමට හරවාගැනීම' සම්බන්ධයෙන් වන සැක පිට අනේකවිධ අවස්ථාවලදී ප්‍රචණ්ඩකාරී ප්‍රහාරවලට මුහුණ දීමටත් අන්‍යාගමකට හරවාගැනීම සඳහා ඔවුන්ට ඇති අයිතිය සීමා කරනු ලැබීමටත් රෝමානු-කතෝලික නොවන ක්‍රිස්තියානි ආගමිකයින්ට සිදුව තිබේ. යුධකාමී ජාතිකවාදීන් විසින් ජනවාගරීක, ආගමික හා අනෙකුත් සුළුතර කණ්ඩායම්වලට එරෙහිව, විශේෂයෙන්ම මුස්ලිම් ජනතාවට එරෙහිව දියත් කර ඇති කලහකාරී ව්‍යාපාර සම්බන්ධයෙන් විශේෂයෙන්ම සලකිල්ල යොමුකළ යුතු වේ.*[26]

2018 දිගන සිදුවූ ප්‍රචණ්ඩත්වය සම්බන්ධයෙන් ඔවුන්ගේ භූමිකාව පිළිබඳව ස්වාධීන විමශර්නයක් සිදුකිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් ෆේස්බුක් ආයතනය සම්බන්ධවීම් හා ප්‍රතිසංස්කරණ ක්‍රියාවලියක් ආරම්භ කර තිබේ.[27] ඔවුන් ශ්‍රී ලංකාව සඳහා ප්‍රතිපත්ති කළමනාකරුවකු බඳවාගැනීමටත්, පළමු වතාවට ඔවුන් සිවිල් සමාජය සමගින් සම්බන්ධවීමේ ක්‍රියාවලියක් ආරම්භ කිරීමටත්, ප්‍රචණ්ඩත්වය අවුලවාලීමට හැකි කථනය සම්බන්ධයෙන් ඔවුන්ට අනතුරු ඇඟවීම සඳහා සිවිල් සමාජයේ හවුල්කරුවන් සමගින් වැඩකිරීමට ආරම්භ කිරීමටත්, සමාජ මාධ්‍ය භාවිතය පිළිබඳව තරුණ පිරිස් පුහුණු කිරීමටත්, සිංහල හා දෙමළ භාෂාවලින් සිදුකෙරෙන කථනය අධීක්ෂණය සඳහා සිංහල හා දෙමළ පරිවතර්කයින් බඳවගැනීමටත්, තම ප්‍රජා ප්‍රමිතීන් සමාලෝචනය ආරම්භ කිරීමටත් යොමු වී තිබේ.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 9වැනි වගන්තියෙන් පහත පරිදි විධිවිධාන සැලසීම තුළින් බුද්ධාගමට වරප්‍රසාද ලබාදෙයි:

> *ශ්‍රී ලංකා ජනරජය බුද්ධාගමට ප්‍රමුඛස්ථානය පිරිනමන්නේ ය. එහෙයින් 10වැනි ව්‍යවස්ථාවෙන් සහ 14(1)(ඉ) ඡේදයෙන් සියළුම ආගම්වලට පිරිනැමෙන අයිතිවාසිකම් ආරක්ෂා කරදෙන අතර, බුද්ධ ශාසනය සුරක්ෂිත කොට පෝෂණය කිරීම රජයේ වගකීම විය යුත්තේ ය.*[28]

---

Sathkumara (Sri Lanka)' (1 May 2020) UN Doc A/HRC/WGAD/2020/8, at www.ohchr.org/Documents/Issues/Detention/Opinions/Session87/A_HRC_WGAD_2020_8_Advance_Edited_Version.pdf.

[26] UN OHCHR, 'Report of the UN Special Rapporteur' para 90 බලන්න.

[27] Article 1, 'Assessing the Human Rights Impact of the Facebook Platform in Sri Lanka', (2018) ලේඛකයා භාරයේ ගොනුකර පවත්වාගෙන යනු ලැබේ.

[28] ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 9වැනි වගන්තිය.

මෙම වගන්තිය හිස් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය වට්නාකමක් පමණක් ලෙස පැවතී නොමැත. බහුතර ප්‍රජාවේ වෛරී අපරාධ සහ වෛරී කථනය පතුරුවන්නන් වරප්‍රසාද සහිතව ක්‍රියාකරන තත්වයක් සහ වරදට දඬුවම් නොලැබෙන සංස්කෘතියක් තුළ ඔවුන්ට වැජඹීමට අවසර දී ඇති තත්වයක් තුළ එය, රටේ සජීවී සමාජ යථාථර්යේ කොටසක් ලෙස පවතිනු ලැබේ. අනෙක් අතට, ආගමික සුළුතර කණ්ඩායම් විසින් බහුතර කණ්ඩායමේ ආගම විවේචනාත්මකව විග්‍රහ කිරීමට ප්‍රකාශනයේ නිදහස සඳහා තමන්ට ඇති අයිතිය යොදාගැනීමට කටයුතු කළ අවස්ථාවන්හි දී එම සුළුතර ආගමික කණ්ඩායම් සාමාජිකයින් අත් අඩංගුවට ගැනීම සඳහා නීතිය තෝරාබේරා අදාළ කරගෙන තිබේ. ආගමික සුළුතර කණ්ඩායම් වෙත සිදුකරන නින්දාසහගත ප්‍රහාර සම්බන්ධයෙන් නම්දරා සිටින රැඩිකල්වාදී බෞද්ධ භික්ෂුවක් නිදහස් කිරීමට කටයුතු කිරීම සහ බහුතර වාගරීක-ආගමික කණ්ඩායම වරදට දඬුවම් නොලබන බවට ඇති අදහස තවදුරටත් ශක්තිමත් කරමින් වාගරීක යුද සමයේ මිනිමැරුම් ගණනාවකට වරදකරු වූ හමුදා නිලධාරියකු නිදහස් කිරීම තුළින් මෙම විෂම වාගරීක-ආගමික යථාථර්ය තවදුරටත් උග්‍ර කරවයි.

## නිදේර්ශ

රජයේ ආයතන, සමාජ මාධ්‍ය වේදිකා, ප්‍රධාන ධාරාවේ මාධ්‍ය සහ සිවිල් සමාජය වෙත පහත නිදේර්ශ ඉදිරිපත් කරනු ලැබේ.

### රජය හා එහි ආයතන සඳහා

1. නීතිය ක්‍රියාත්මක කරන නිලධාරීන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ආරක්ෂා කරන බවටත් නීතිය හා සාමය පවත්වාගෙන යාමේදී සහ වෛරී අපරාධ සිදුකළ බවට චෝදනා ලැබූවන් අත් අඩංගුවට ගැනීමේ දී ස්වාධීනව හා අපක්ෂපාතීව කටයුතු කරන බවත් සහතික කරගැනීම.

2. නීතිය ක්‍රියාත්මක කරන නිලධාරීන් සහ රජයේ නිලධාරීන් ආගමික ප්‍රචණ්ඩත්වයේ හෝ වෛරී කථනයේ නිරත නොවන බව සහ මෙකී ප්‍රමිතීන් උල්ලංඝනය කෙරෙන ඕනෑම අවස්ථාවකදී අදාළ නිලධාරීන්ට එරෙහිව නිසි ක්‍රියාමාගර් ගන්නා බව සහතික කරගැනීම.

3. නීතිපති දෙපාතර්මේන්තුව ස්වාධීනව, අපක්ෂපාතීව සහ එලදායී අන්දමින් වෛරී අපරාධ හා වෛරී කථනය විමශර්නය සහ නඩුපැවරීම සිදුකරන බව සහතික කරගැනීම.

4. එම පුද්ගලයින් පූජ්‍ය පක්ෂයේ සාමාජිකයින් වුවද, පාලර්මේන්තු මන්ත්‍රීවරුන් වුවද, නැතහොත්, සමාජයේ වරප්‍රසාද ලත් වෙනත් කොටසකට අයත් වන්නකු වුවද, වෛරී අපරාධවල හා වෛරී කථනයේ නිරත වූ පුද්ගලයින්ට චෝදනා ගොනුකර නඩුපැවරීම සිදුකෙරෙන බව සහතික කරගැනීම.

5. ආගමික ප්‍රචණ්ඩත්වය හා වෛරී කථනය හා අදාළ වන නීති සම්බන්ධයෙන් අධිකරණ නිලධාරීන් හා නීතිය ක්‍රියාත්මක කරන නිලධාරීන් පුහුණු කිරීම සඳහා ආයෝජනය කිරීම.

6. නීතිය ක්‍රියාත්මක කරන ආයතන, නීතිපති දෙපාතර්මේන්තුව සහ අධිකරණ අමාත්‍යාංශය ආගමික පෙළඹවීම් මත සිදුවූ ප්‍රචණ්ඩත්වය සහ වෛරී කථනය සම්බන්ධයෙන් සිදුකෙරෙමින් පවතින විමශර්නය හා නඩුකටයුතු පිළිබඳව සක්‍රියව තොරතුරු හෙළිදරව් කරන බව සහතික කරගැනීම.

7. නොඉවසීම, වෙනස්කොට සැලකීම, වාගර්ක හෝ ආගමික ඒකාකෘතිකරණය සහ වෛරී කථනය ප්‍රසිද්ධියේ හෙලාදැකීම.

## සමාජ මාධ්‍ය වේදිකා සඳහා

1. ස්වකීය වේදිකාවන් තුළ ඇති සියළුම පෝස්ටු දැඩි අධීක්ෂණයකට ලක්වන බව සහතික කරගැනීම

2. අදාළ වේදිකාවේ ප්‍රජා ප්‍රමිතීන් උල්ලංඝනය හඹා යැමටත් අධීක්ෂණයටත් වඩාත් වැඩි කෘත්‍රිම බුද්ධි ශක්‍යතාවයක් යෙදවීමට ආයෝජනය කිරීම

3. සිංහල හා දෙමළ භාෂාවලින් වන පෝස්ටු සහ එම භාෂාවලින් කරන කොමෙන්ටු අධීක්ෂණය සඳහා ශක්‍යතා වර්ධනයට ආයෝජනය කිරීම

4. අන්තර්ජාලය ඔස්සේ වන වෛරයට ප්‍රතිචාර දක්වනු වස් ඒවා ප්‍රමාණවත් පරිදි රාමුගත කර ඇතිබව සහතික කරගැනීම සඳහා ප්‍රජා ප්‍රමිතීන් නැවත ළ්සලකා බැලීම හා සමාලෝචනය.

5. සිවිල් සමාජය සහ මහජනයා සමගින්, විශේෂයෙන්ම තරුණ පිරිස් සමගින් සමාජ මාධ්‍ය වේදිකා වගකීමෙන් යුතුව භාවිතා කිරීම පිළිබඳව අඛණ්ඩව සම්බන්ධ වී වැඩකිරීම

## ප්‍රධාන ප්‍රවාහයේ මාධ්‍ය සඳහා

1. මාධ්‍ය ආයතන ඔස්සේ සුළුතර ආගමික කණ්ඩායම් සහ අනෙකුත් අවදානම්පාත්‍ර කණ්ඩායම්වලට එරෙහිව වෛරය ව්‍යාප්ත නොකරන බව සහතික කරගැනීම සහ වාගරීක හෝ ආගමික කණ්ඩායම් සම්බන්ධයෙන් ඍණාත්මක ඒකාකෘතීන් බෙදාහැරීමෙන් වැලකීම.

2. ශ්‍රී ලංකාවේ වාගරීක, ආගමික සහ සමාජ විවිධත්වය විකාශය වන වැඩසටහන් තුළ, ප්‍රකාශයට පත් කරන පුවත් හා ලිපි තුළ පිළිබිඹු වන බව සහතික් අකරගැනීම.

## සිවිල් සමාජය සඳහා

1. වෛරී කථනය හා ආගමෙන් පෙළඹී සිදුකරන ප්‍රචණ්ඩ ක්‍රියා යන දෙකම සම්බන්ධයෙන් විමශර්න සිදුකිරීම හා නඩුපැවරීම පිළිබඳව පොලීසිය, අධිකරණ අමාත්‍යාංශය හා නීතිපති දෙපාතර්මේන්තුව ඇතුළු රාජ්‍ය ක්‍රියාධරයින් සමගින් අඛණ්ඩව සම්බන්ධ වීම.

2. ආගමෙන් පෙළඹී සිදුකරන ප්‍රචණ්ඩ ක්‍රියා පිළිබඳ සිදුකෙරෙන විමශර්නවල තත්වය සහ වෛරී කථන සම්බන්ධයෙන් සිදුකරන අත් අඩංගුවට ගැනීම් පිළිබඳව තොරතුරු ලබාගැනීමට තොරතුරු ලබාගැනීමේ පනත දිගින් දිගටම භාවිතා කිරීම.[29]

3. අන්තජර්ාලය හරහා සිදුවන වෛරී කථනය දිගින් දිගටම අධීක්ෂණය සහ සොයාගන්නා කරුණු හැකිතාක් දුරට බෙදාහැරීම.

4. ඔවුන්ගේ ප්‍රජා ප්‍රමිතීන් යොදාගැනීම සම්බන්ධයෙන් සහ සිංහල, දෙමළ, ඉංග්‍රීසි යන භාෂා තුනෙන්ම එම ප්‍රමිතීන් අධීක්ෂණය සම්බන්ධයෙන් ෆේස්බුක් සහ අනෙකුත් වේදිකා සමගින් අඛණ්ඩව සම්බන්ධ වීම.

5. අන්තජර්ාලයේ වෛරී කථනයට විරුද්ධ දෙසට දිවෙන නිමර්ාණශීලී ප්‍රති-ආඛ්‍යානයක් පල කිරීමටත්, සිතාමතා බොරු ප්‍රචාර සිදුකිරීමට අභියෝග කිරීමටත්, වාගර්ික, ආගමික හා ස්ත්‍රීපුරුෂ සමාජභාවීය හා අනෙකුත් ඒකාකෘති විරසථ්ාපනයට අභියෝග කිරීමටත් සමාජමාධ්‍ය තුළ අන්තගර්තය නිමර්ාපකයින්ට පුහුණු ලබාදීම සඳහා ආයෝජන කිරීම.

6. ෆේස්බුක් වැනි ගෝලීය වේදිකා සමගින් සම්බන්ධවීම පිණිස සහ තම යහ පරිචයන් හා ලැබූ අත්දැකීම් බෙදාහදාගනු පිණිස, ආසියානු කළාපයේ හා අනෙකුත් කළාපවල සිවිල් සමාජ සන්ධාන සමගින් හවුල්වීම.

[29] මේ සම්බන්ධයෙන් වන NCEASL මුලපිරිම බලන්න: '*Religious Freedom Violations in Sri Lanka: Responses of Law Enforcement Authorities and the Judiciary*', 2020.